# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 අප්‍රේල් 09 වන අඟහරුවාදා**
2013 ஏப்ரல் 09 செவ்வாய்க்கிழமை
Tuesday 09th April 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.55 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.55 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.55 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදන
ANNOUNCEMENTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"ගරු අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින් 2013 මාර්තු මස 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලදුව, 46 අ(2)(අ) වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම සඳහා එක් එක් පළාත් සභාවට යොමු කිරීමට විධාන කරන ලද, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 5 (අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා එවනු ලබන බව, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් අංක Bills/250 හා 2013 මාර්තු මස 21 දාතමින් යුතු ලිපිය මගින් මෙම පළාත් සභාවේ ලේකම්වරයා වෙත දැනුම් දී ඇති බව කාරුණිකව දන්වා සිටිනවා.*

*මීළඟ සභා රැස්වීම 2013 මැයි මස 07 වන දින පැවැත්වීමට සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එකඟතාවය පළ කළ නිසාත්, එම පනත් කෙටුම්පත පිළිබඳව මෙම පළාත් සභාවේ අදහස් දැක්වීම අද දින තුළදීම සිදු කිරීමට එකඟතාවය පළ කළ නිසාත්, ඊට ඉඩ සැලසෙන පරිදි අද දින න්‍යාය පත්‍රයට ඇතුළත් කර තිබෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා.*

*2013.03.27 වන දින සභා කටයුතු පිළිබඳ කාරක සභාව විසින් යොමු කරනු ලැබූ එම පනත් කෙටුම්පත පිළිබඳව 2013.04.02 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීමේ වාර්තාව ද ලැබී තිබෙනවා.*

*එම නිසා අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක 04 හි වැඩ කටයුතුවලට එළඹුන විටදී ඒ පිළිබඳව ඔබතුමන්ලාට අදහස් දැක්වීමට අවස්ථාව සැලසෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

*ii*

***බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් ධූරය : ජේ.එම්.සී. ජයන්ති විජේතුංග මහත්මිය***

*"ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති අංක සී.එස්.ඒ./1/8/18 හා 2013.03.30 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනී ජේ.එම්.සී. ජයන්ති විජේතුංග මහත්මිය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් ලෙස පත් කර ඇති බව සතුටින් දැනුම් දෙනවා.*

*1987 අංක 42 දරන පළාත් සභා පනතේ 31 වන වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර අතිගරු ජනාධිපතිතුමා විසින් කර ඇති එම පත්වීම අනුව, එතුමිය 2013.04.01 වන දින සිට එම තනතුරේ රාජකාරී කටයුතු භාරගත් බවත් දැනුම් දී ඇති බව කාරුණිකව දැනුම් දෙනවා.*

එතුමියට සභාවේම සුභාශිංසන පළ කරනවා. "

# ලිපිලේඛනාදිය පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)

Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, *"ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් වාර්තා කිරීම සඳහා යොමු කර ඇති උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත මම මෙම සභාවට පිළිගන්නවා."*

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

එම පනත් කෙටුම්පත දැනටමත් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත අද දිනට නියමිත න්‍යාය පත්‍රය සමඟම තැපැල් මඟින් ලැබෙන්නට සලස්වා තිබෙනවා.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

2013.03.19 සහ 27 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තා මම ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු** [ගරු කීර්ති උඩවත්ත මන්ත්‍රීතුමා වෙනුවෙන්]

Hon. Rose Fernando [On Behalf of Hon. Keerthi Udawatta]

ගරු සභාපතිතුමනි, *"2013 මාර්තු මස 05, 19 සහ අප්‍රේල් මස 02 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තා මම පිළිගන්වනවා "*

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු ලලිත් වර්ණකුමාර**

Hon. Lalith Warnakumara

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම පිළිගන්වනවා.

i. බුලත්සිංහල, අතුර, ජනහිත පෙදෙස හි එච්.ජී. චමින්ද උදය කුමාර යන අයගේ පෙත්සම,

ii. ගුරුඑබැද්ද, අද්දරගොඩ, "මනුසර" හි එම්.කේ. සරත් කුමාර යන අයගේ පෙත්සම,

iii. බුලත්සිංහල, ගල්කැටිය හි පොල්ගහගේ චන්ද්‍රවතී යන අයගේ පෙත්සම,

iv. ගෝවින්න, කොටා රෝඩ්, කුසුන්පාය හි පී.ටී. කුසුමාවතී යන අයගේ පෙත්සම,

v. ගෝවින්න, නානවල හි කේ.ආර්. නිමලාවතී යන අයගේ පෙත්සම සහ

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**

Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, කොළඹ 10, මාළිගාවත්ත වෙළඳසැල, වෙළඳසැල් පරිපාලක, එන්.ආර්. වීරරත්න යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නයට පිළිතුරු ලබා ගැනීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට එවෙලේ ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නොසිටි නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පිළිතුර සභාගත කරන ලදී.***

*As Hon. Nalinda Jayathissa member, was not in the Council Chamber at the time to refer the question*

*in the name of the Hon. Member referred to under No. 01 in the agenda to the Hon. Chief Minister for obtaining a reply, the answer was tabled by the Hon. Chief Minister.*

***[සභාගත කරන ලද පිළිතුර]**

*[Tabled Answer]*

**ප්‍රශ්නය :**

අ. බත්තරමුල්ල බටපොත ශ්‍රී සුදර්ශන විද්‍යාලය සපිරි පාසල් ව්‍යාපෘතියට ඇතුළත් වී තිබේද?

**පිළිතුර :**

අ. ඔව්.

**ප්‍රශ්නය :**

ආ. ඒ අනුව එහි ද්විතීයික අංශය ඉවත් කිරීම අරඹන්නේ කවර වර්ෂයක සිටද?

**පිළිතුර :**

ආ. 2012

**ප්‍රශ්නය :**

ඇ. එම පාසල සපිරි පාසල් ව්‍යාපෘතියට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ පළාත් සභා මන්ත්‍රී කමිටුවේ අනුමැතිය ලබා දී තිබේද?

**පිළිතුර :**

ඇ. ඔව්.

**ප්‍රශ්නය :**

ඈ. එම පාසලින් ද්විතියික පංති ඉවත් කිරීම වැළැක්වීම වෙනුවෙන් 2013.02.03 දින විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් උපහාර උත්සවයක් පැවැත්වීද?

**පිළිතුර :**

ඈ. පාසලට භෞතික සම්පත් ලබා දීම වෙනුවෙන් උපහාර උත්සවයක් පවත්වා ඇත.

**ප්‍රශ්නය :**

ඉ. ඒ සඳහා එම විදුහලේ විදුහල්පතිවරයා සම්බන්ධවීද?

**පිළිතුර :**

ඉ. ඔව්.

**ප්‍රශ්නය :**

ඊ. එහිදී උපහාර ලැබූ අය කවුද?

**පිළිතුර :**

ඊ. 1. ගරු පළාත් සභා මන්ත්‍රී හෙක්ටර් බෙත්මගේ මැතිතුමා
2. ගරු පළාත් සභා මන්ත්‍රී ජගත් කුමාර මැතිතුමා

**පසු සටහන**

බටපොත සුදර්ශන මහ විද්‍යාලයේ 2012 වර්ෂයේ සිට පාසල් දහසක් සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ බත්තරමුල්ල සුභූති මහ විද්‍යාලයේ පෝෂිත පාසලක් ලෙස නම් කළ අතර, 2012 වර්ෂයේ 5 වන ශ්‍රේණිය සමත් සිසුන් 6 වන ශ්‍රේණියට සුභූති විද්‍යාලයට ඇතුළත් වී ඇත. නමුත් කලාප කාර්යාලයේ ව්‍යුහ කමිටුව සුභූති මහ විද්‍යාලය පාසල් දහසේ ව්‍යාපෘතියෙන් සංවර්ධනය වනතුරු 2013 වර්ෂයේ සිට 6 වන ශ්‍රේණිය බටපොත සුදර්ශන විද්‍යාලයේ එලෙසම පවත්වාගෙන යාමට තීරණය කර ඇත.

**න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නයට පිළිතුරු ලබා ගැනීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කිරීමට එවෙලේ ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නොසිටි නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පිළිතුර සභාගත කරන ලදි.**

*As Hon. Nalinda Jayathissa member, was not in the Council Chamber at the time to refer the question in the name of the Hon. Member referred to under No. 02 in the agenda to the Hon. Chief Minister for obtaining a reply, the answer was tabled by the Hon. Chief Minister.*

***[සභාගත කරන ලද පිළිතුර]**

*[Tabled Answer]*

**ප්‍රශ්නය :**

2005 සිට 2012 දක්වා කළුතර අධ්‍යාපන කලාපයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී

අ. එක් එක් විෂය සඳහා පෙනී සිටි සිසුන් ගණන,

ආ. එක් එක් විෂය සමත් වූ ප්‍රමාණය,

ඇ. එක් එක් විෂය සඳහා සමත්වීමේ ප්‍රතිශතය,

මෙම පළාත් සභාවට ඉදිරිපත් කරන්නේද?

ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කරමි.

පිළිතුර :

ඇමුණුම-01

අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල 2005-2012 කළුතර අධ්‍යාපන කලාපය

| විෂය | 2005 | | | 2006 | | | 2007 | | | 2008 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි සිසුන් ගණන | සමත්වූ සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | පෙනී සිටි සිසුන් ගණන | සමත්වූ සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | පෙනී සිටි සිසුන් ගණන | සමත්වූ සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | පෙනී සිටි සිසුන් ගණන | සමත්වූ සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය |
| බුද්ධ ධර්මය | 5394 | 4467 | 83% | 5163 | 4394 | 85% | 5472 | 4627 | 85% | 5237 | 4557 | 87% |
| ක්‍රිස්තියානි ධර්මය | 114 | 103 | 90% | 222 | 202 | 91% | 105 | 90 | 86% | 229 | 218 | 95% |
| හින්දු ධර්මය | 17 | 11 | 65% | 15 | 10 | 67% | 29 | 12 | 41% | 76 | 59 | 78% |
| ඉස්ලාම් ධර්මය | 1006 | 863 | 86% | 1090 | 915 | 84% | 940 | 825 | 88% | 1177 | 1082 | 92% |
| සිංහල | 6435 | 5168 | 80% | 5652 | 4398 | 78% | 6464 | 5371 | 83% | 5421 | 4468 | 82% |
| ඉංග්‍රීසි | 6840 | 3105 | 45% | 6753 | 2954 | 44% | 6744 | 3376 | 50% | 6788 | 2329 | 34% |
| ගණිතය | 6912 | 3389 | 49% | 6748 | 2896 | 43% | 6932 | 3598 | 52% | 6896 | 3755 | 54% |
| විද්‍යාව හා තාක්ෂණවේදය | 6750 | 3839 | 57% | 6551 | 3172 | 48% | 6844 | 3362 | 49% | 6879 | 3634 | 53% |
| ඉතිහාසය හා සමාජ අධ්‍යයනය | 6723 | 5343 | 79% | 6520 | 4891 | 75% | 6809 | 5081 | 75% | 6722 | 4773 | 71% |
| චිත්‍ර | 2282 | 1278 | 56% | 2223 | 1310 | 59% | 2266 | 1617 | 71% | 2064 | 1424 | 69% |
| නැටුම් | 1738 | 1502 | 86% | 1706 | 1478 | 87% | 2539 | 1556 | 61% | 1500 | 1394 | 93% |
| සංගීතය | 1624 | 1029 | 63% | 1636 | 975 | 60% | 1444 | 827 | 57% | 1255 | 949 | 76% |
| නාට්‍ය හා රංගකලාව | 134 | 97 | 72% | 78 | 72 | 92% | 133 | 111 | 83% | 253 | 234 | 92% |
| දෙමළ | 966 | 765 | 79% | 864 | 662 | 77% | 916 | 738 | 81% | 1024 | 763 | 75% |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 1236 | 1118 | 90% | 2000 | 1796 | 90% | 2146 | 1952 | 91% | 2127 | 1941 | 91% |
| කෘෂිකර්මය | 1409 | 1039 | 74% | 1627 | 1157 | 71% | 1641 | 813 | 50% | 1381 | 923 | 67% |
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 3053 | 2399 | 79% | 2306 | 1763 | 76% | 1435 | 1148 | 80% | 3079 | 2299 | 75% |
| ඉදිකිරීම් තාක්ෂණය | 186 | 80 | 43% | 100 | 76 | 76% | 13 | 8 | 62% | | | |
| යාන්ත්‍රික තාක්ෂණය | 66 | 42 | 64% | 68 | 45 | 66% | 71 | 55 | 77% | | | |
| ශිල්ප කලා | 65 | 53 | 82% | 501 | 386 | 77% | 38 | 31 | 82% | 160 | 127 | 79% |
| විදුලිය හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය | 147 | 110 | 75% | 95 | 85 | 89% | 86 | 66 | 77% | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | | | | | | | | | 953 | 892 | 94% |
| ගෘහ ආර්ථික විද්‍යාව | 1537 | 927 | 60% | 998 | 776 | 78% | 1701 | 1125 | 66% | 1356 | 1121 | 83% |

## අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල 2005-2012 කළුතර අධ්‍යාපන කලාපය

| විෂය | 2009 | | | 2010 | | | 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි සිසුන් ගණන | සමත්වූ සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | පෙනී සිටි සිසුන් ගණන | සමත්වූ සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | පෙනී සිටි සිසුන් ගණන | සමත්වූ සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය | පෙනී සිටි සිසුන් ගණන | සමත්වූ සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය |
| බුද්ධ ධර්මය | 5198 | 4270 | 82% | 5377 | 4418 | 82% | 5255 | 4605 | 88% | | | |
| ක්‍රිස්තියානි ධර්මය | 250 | 225 | 90% | 248 | 213 | 86% | 222 | 186 | 84% | | | |
| හින්දු ධර්මය | 78 | 67 | 86% | 80 | 67 | 84% | 91 | 78 | 86% | | | |
| ඉස්ලාම් ධර්මය | 1131 | 1054 | 93% | 1125 | 1020 | 91% | 1070 | 930 | 87% | 2012 අ.පො.ස. (සා/පෙ) විභාග ප්‍රතිඵල මේවන තෙක් නිකුත් කර නැත | | |
| සිංහල | 5730 | 4436 | 77% | 5778 | 4708 | 81% | 5683 | 4616 | 81% | | | |
| ඉංග්‍රීසි | 6773 | 3146 | 46% | 6866 | 3653 | 53% | 6680 | 3756 | 56% | | | |
| ගණිතය | 6798 | 3804 | 56% | 6908 | 4432 | 64% | 6653 | 3852 | 58% | | | |
| විද්‍යාව හා තාක්ෂණවේදය | 6485 | 3438 | 53% | 6860 | 4457 | 65% | 6638 | 4427 | 67% | | | |
| ඉතිහාසය හා සමාජ අධ්‍යයනය | 6686 | 4302 | 64% | 6845 | 5399 | 79% | 6655 | 4489 | 67% | | | |
| චිත්‍ර | 2078 | 1554 | 75% | 2121 | 1458 | 69% | 2013 | 1579 | 78% | | | |
| නැටුම් | 1351 | 1010 | 75% | 1172 | 1114 | 95% | 1297 | 1193 | 92% | | | |
| සංගීතය | 1232 | 807 | 66% | 922 | 790 | 86% | 887 | 729 | 82% | | | |
| නාට්‍ය හා රංගකලාව | 293 | 246 | 84% | 202 | 202 | 100% | 223 | 210 | 94% | | | |
| දෙමළ | 977 | 778 | 80% | 977 | 766 | 78% | 967 | 730 | 75% | | | |
| සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | 2361 | 2241 | 95% | 2748 | 2451 | 89% | 2966 | 2709 | 91% | | | |
| කෘෂිකර්මය | 1101 | 608 | 55% | 1175 | 968 | 82% | 1063 | 792 | 75% | | | |
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 3402 | 2487 | 73% | 3301 | 2866 | 87% | 3489 | 2767 | 79% | | | |
| ඉදිකිරීම් තාක්ෂණය | | | | | | | | | | | | |
| යාන්ත්‍රික තාක්ෂණය | | | | | | | | | | | | |
| ශිල්ප කලා | 21 | 21 | 100% | 57 | 42 | 74% | 142 | 112 | 79% | | | |
| විදුලිය හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය | | | | | | | | | | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 1032 | 913 | 88% | 994 | 874 | 88% | 950 | 742 | 78% | | | |
| ගෘහ ආර්ථික විද්‍යාව | 1271 | 823 | 65% | 1331 | 1077 | 81% | 1271 | 966 | 76% | | | |

# කර්මාන්ත දෙපාර්තමේන්තුව : නූල් මිලදී ගැනීම
DEPARTMENT OF INDUSTRIES : YARN PURCHASING

03.

**මංජු ශ්‍රී අරංගල ගරු විපක්‍ෂ නායකතුමා විසින් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V(1)13/05)**

අ. 2010 වර්ෂය සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව නූල් මිලදී ගත් ආයතනය නම් කරන්නේද?

ආ. එම නූල් වර්ණ ගැන්වීම කරන ලද ආයතනය නම් කරන්නේද?

ඇ. නූල් මිලදී ගත් ආයතනයෙන්ම වර්ණ ගැන්වීම කළ බව පිළිගන්නේද?

ඈ. මිලදී ගත් නූල් මහර ගබඩාව වෙත එම ප්‍රමාණයෙන්ම ලැබී නැති බව පිළිගන්නේද?

ඉ. එසේ මිලදී ගත් නූල්වලින් මහර ගබඩාව වෙත නොලැබුණු නූල් ප්‍රමාණය කොතෙක්ද?

ඊ. මෙහිදී සිදු වී ඇති බරපතළ අක්‍රමිකතාව පිළිබඳ අල්ලස් හෝ දූෂණ කොමිසම මඟින් පරීක්ෂණයක් පවත්වන බව පිළිගන්නේද?

උ. එසේ නම් එහි ප්‍රගතිය පැහැදිලි කරන්නේද?

ඌ. මෙම අක්‍රමිකතාවයට සම්බන්ධ නිලධාරීන් පිළිබඳ දෙපාර්තමේනතු මට්ටමින් විනය පරීක්ෂණයක් පවත්වන්නේද?

එ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

අ. 2010 වර්ෂයේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියකින් කැලණි ෆැබ්රික් ආයතනයෙන් සහ මාස්ටර් කලර්ස් ආයතනයෙන් නූල් මිලදී ගෙන ඇත. ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් ලංසු කැඳවා ඒ අනුව තාක්ෂණික කමිටුවක් පත් කර ඒ කමිටුවේ නිර්දේශ අනුව මෙම මිලදී ගැනීම් සිදු කර ඇත. විස්තර මෙසේය.

| මානය | ප්‍රමාණය (කිලෝ) | ආයතනය | වටිනාකම රු.ශ. |
|---|---|---|---|
| 16 | 4994.00 | කැලණි ෆැබ්රික්ස් ආයතනය | 17,47,900.00 |
| 2/80 | 5992.80 | කැලණි ෆැබ්රික්ස් ආයතනය | 74,91,000.00 |
| 2/20 | 4176.80 | මාස්ටර් කලර්ස් ආයතනය | 20,46,632.00 |
| 2/30 | 4812.40 | මාස්ටර් කලර්ස් ආයතනය | 25,50,572.00 |
| 10 | 4998.54 | මාස්ටර් කලර්ස් ආයතනය | 13,74,598.50 |

ආ. නූල් වර්ණ ගැන්වීම සඳහාද ප්‍රසිද්ධ පුවත්පත් මඟින් මිල ගණන් කැඳ වූ අතර, ඒ සඳහා මිල ගණන් එවූ ආයතන වන්නේ කැලණි ෆැබ්රික්ස් ආයතනය හා ඔක්ස්පර්ඩ් ඩයින් ආයතනයි. තාක්ෂණ කමිටුවේ නිර්දේශ අනුව, කැලණි ෆැබ්රික්ස් ආයතනය වර්ණ ගැන්වීම සඳහා තෝරාගන්නා ලදී.

ඇ. ඔව්.

ඈ. නැත.

ඉ. අදාළ නොවේ.

ඊ. නැත.

උ. අදාළ නොවේ.

ඌ. අදාළ නොවේ.

එ. අදාළ නොවේ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් දැනට අල්ලස් හා දූෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක් සිදු වන්නේ නැහැයි කියලා ගරු ඇමතිතුමා පිළිගන්නවාද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, අල්ලස් හා දූෂණ දෙපාර්තමේන්තුව 1994 අහෝසි කළා. ඒ නිසා එහෙම පරීක්ෂණයක් කිසිසේත්ම තිබෙන්න විධියක් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කොමිසමේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නයට අදාළව පිළිතුරු දීලා තිබෙනවා. මෙහෙමයි ගරු සභාපතිතුමනි. වෙනදා මෙතුමා අහපු ප්‍රශ්නයට මම පිළිතුරු දීලා, මෙතුමා බලාපොරොත්තු වෙන්නේ මොන ප්‍රශ්නයද කියලා ඒකටත් මම උත්තර දුන්නා. මෙහෙම කළාම මෙතුමා කවදාවක්වත් හරියට ප්‍රශ්නය අහන්න ඉගෙන ගන්නේ නැහැ. ඒක නිසා මෙතුමා හදා ගැනීමේ පරම පවිත්‍ර චේතනාවෙන්ම තමයි මම අද වැඩි විස්තර නොකියන්නේ. ඒ නිසා මම ඔබතුමාට මේ ප්‍රශ්නයට උත්තර දුන්නා. මේ කාරණය සම්බන්ධයෙන් අල්ලස් හා දූෂණ කොමිසමේ කිසිම පරීක්ෂණයක් නැහැ. ඔබතුමාට අලුත් ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ දේ අහන්න. එතකොට අපි උත්තර දෙන්නම්.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි දන්න විධියට විශාල ලෙස දූෂණ අක්‍රමිකතා වෙන ආයතන මේවා. මේ ඇමැතිවරයා යටතේ ආයතන ගණනාවක් වහලා තිබුණා. ඒ නිසා අපි මේවා අහනකොට –

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, විවාදයක් කරන්න කියන්න. උත්තර දෙන්නම්. ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙනවා මිසක් ප්‍රකාශ නිකුත් කරන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම අයවැය ලේඛනය ඉදිරිපත් කරන වේලාවේදීත් වහපු ආයතන 18 ක් ගැන විස්තර කරලා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාට ප්‍රකාශයක් කරන්න දෙන්න බැහැ. ඔබතුමා –

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමාට ප්‍රශ්නය අහගන්න බැරි වුණාට මම මොනවා කරන්නද?

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ප්‍රශ්නයකට උත්තරයක් ඇහුවාම –

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා හිටියා නම් හරියට ප්‍රශ්නය අහනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

වෙන දෙයක් කියලා වැඩක් නැහැ. ඇමැතිවරයාගේ ගෞරවය ආරක්ෂා කරගෙන උත්තරය දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා –

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

අහලා තිබෙන ප්‍රශ්නයට උත්තරය දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්. ඉන් එහාට ඔබතුමාට යන්න දෙන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සෙල්ලම් බඩු වෙන්න යනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මේ පිළිතුර පිළිබඳව මම වගකීමෙන් බැඳී සිටිනවා. මේ පිළිතුරේ කිසියම් වැරැද්දක් තිබෙනවා නම්, මා ඇමැති ධූරයෙන් ඉල්ලා අස් වෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔය ඇමැති ධූරයෙන් ඉල්ලා අස් වුණු හතරවැනි සැරේ.

[සභාවේ සෝෂා]

මේ සභාවේදීම ඇමැති ධූරයෙන් ඉල්ලා අස් වුණු හතරවැනි සැරේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අස් වෙන්න ඕනෑ. නමුත් මේකේ ඉන්නවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා වාඩි වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කනවා නොවෙයි, උලා කාගෙන ඉන්නවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් අහන්න පුළුවන් විපක්ෂ නායකවරයෙක් වෙන්න ඕනෑ. මේ යූසුෆ් ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. ප්‍රශ්නයක් අහන්න පුළුවන් කෙනෙක් මෙතැන සිටියා නම් මේ ප්‍රශ්නය විසඳෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරුණිකාකර වාඩි වෙන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඔය මේ සභාවේදී අස් වුණු හතර වෙනි සැරේ.

**ගරු යූ. ජෝර් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමා මීට කලින් පස් පාරක් අස් වුණා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කනවා නොවෙයි, මේ අමාත්‍යාංශය උලා කනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. වීඩියෝ කරනවා නේ? ඒක නිසයි මේ පොඩි පොඩි පාට් දාන්නේ. විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, කරුණාකර වාඩි වෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අර වීඩියෝ කරන්නේ මගේ මාධ්‍ය අංශයෙන්. ඒක හින්දා එපමණ කළබල වෙන්න ඕනෑ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් ආණ්ඩුවට ඕනෑම ප්‍රශ්නයක් අදාළ නොවේ.

## වත්තල - ඇළකන්ද මංසන්ධිය : පෞද්ගලික බස් නවතා තැබීම
WATTALA-ELAKANDA JUCTION: PARKING PRIVATE BUSES

**04.**

**ඊ. සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/V(1)13/06)**

අ. වත්තල - ඇලකන්ද මංසන්ධියේ පෞද්ගලික බස් නවතා තැබීම නිසා විශාල අවහිරතාවයක් ඇති වන බව ඔබතුමා දන්නවාද?

ආ. මෙම අවහිරතාවය මහ හරවා ගැනීමට සුදුසු ක්‍රියා මර්ගයක් ගැනීමට සැලසුමක් තිබේද?

ඇ. එසේ නම් එම සැලසුම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද?

ඈ. නොඑසේ නම් එම අපහසුතාවය මහහරවා ගැනීමට ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. වත්තල - ඇලකන්ද බස් නැවතුම්පළ පළමු අදියර සඳහා ලක්ෂ 15 ක් වෙන් කර ඇත. මාස 03 ක කාලය තුළ දී ඉදි කිරීම් කටයුතු නිම කිරීමට යෝජිත ය. එම යෝජිත ස්ථානයේ ඉදි කිරීම් කටයුතු අවසන් වූ පසු බස් රථ ගාල් කර තබන අතර, එම ස්ථානයේම සිට ගමන් වාර ආරම්භ කිරීමට ද යෝජිතය.

ඈ. ඉහත අංක 03 පිළිතුරට අනුව අදාළ නොවේ.

ගරු සභාපතිතුමනි, මෙය හදන බව දන්න නිසා මේ ප්‍රශ්නයත් ඇහුවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, ඒක නිසා නොවෙයි ඇහුවේ. මේක දැන් අවුරුදු ගණනාවක් තිස්සේම කථා කරන ප්‍රශ්නයක්. මොකද, හැමිල්ටන් ඇළ බොහොම වේගයෙන් සංවර්ධනය වෙගෙන යනවා. ඒක බොහොම හොඳ වැඩක්. දැන් ඒ අවස්ථාවේදී එතැන විශාල අවහිරතාවයක් තිබෙනවා. බස් ගෙනැල්ලා ගාල් කරලා. මේක කලින් කරන්න තිබුණු වැඩක්. දැන් මේ ඉඩම තියෙන්නේ කොහේද කියලයි අපට දැනගන්න ඕනෑ. හදන තැන. ලක්ෂ 15 ක් වෙන් කෙරුවයි කියලා ඔබතුමා කිව්වා. ඒ ලක්ෂ 15 වෙන් කරලා හදන්න හදන, දැන් මේක සංවර්ධනය කරන ඉඩම කොතැනද කියලා තමයි මට දැන ගන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මට දෙන්න තිබෙන්නේ ගරු විපක්ෂ නායකතුමාට, උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා දීපු උත්තරයම තමයි. ප්‍රශ්නයක් අහන්න ඉගෙන ගන්න කියලා. ඒකේ අහලා නැහැ ඉඩම ගැන.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

තමුන්නාන්සේ උත්තරයක් දුන්නා –

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒකේ අහලා නැහැ එහෙම තැනක් ගැන.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, බොහොම පැහැදිලි උත්තරයක් දුන්නා ලක්ෂ 15 ක් වෙන් කරලා –

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා ප්‍රශ්නය අහලා නැහැ ඉඩම කොහෙද කියලා. මුදල් අහලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම අහන්න කැමැතියි, ලක්ෂ 15 ක් වෙන් කරලා මාස තුනක් ඇතුළත වැඩ ඉවර කරන්නේ කොයි ඉඩමේද කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉඩම අහලා නැහැ. ඉඩම ප්‍රශ්නයට අහලා නැහැ නේ ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා –

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

සමූපකාරයට, වත්තල ප්‍රාදේශීය සභාව ඔබතුමාගේ කාලයේ බදු දීලා තිබුණු ඉඩම. නඩුවක් කියලා, නඩුවෙන් ජයග්‍රහණය කරලා නැවත ඒක අපේ අධිකාරියට පවරලා, ඒක අරගෙන තමයි අපි මේ වැඩේ කරන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒ ඉඩම අයිති වත්තල ප්‍රාදේශීය සභාවට නොවෙයි. ඒ ඉඩම අයිති සමූපකාරයට. මට අයිතියක් නැහැ ඒක. දැන් එතැනද හදන්නේ. ඒකයි දැන ගන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

සමූපාකාරයේ නඩුවක් කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා දැන් උත්තර දුන්නා නේ? ආපසු ඕකට යන්න ඕනෑ නැහැ. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

තමුන්නාන්සේගේ නමත් දාලා මම විවෘත කරලා දෙන්නම්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඉඩම ගැන ප්‍රශ්නය අහලා නැහැ.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේ බස්නාහිර පළාතේ සාමාන්‍යයෙන් ඔප්පු ලිවීමේදී, මම කලින් අවස්ථාවකත් මෙම සභාවේ අවධානයට යොමු කෙරුවා. යම්කිසි ඔප්පුවක් ලියලා ඉවර වුණාම අපේ පළාත් සභාවේ ආදායම් අංශයෙන් ලියුමක් එවනවා. මෙම ලියලා තිබෙන ඔප්පුවට නියමිත වටිනාකම යොදලා නැහැ. ඒ සම්බන්ධයෙන් තොරතුරු දෙන්න කියලා. දැන් මේ විධියට අවස්ථා කීපයකදීම අදාළ ගැනුම්කරුවාට කාර්යාලයට එන්න සිද්ධ වෙනවා. එසේ ආවත් මේ ගැනුම්කරුවාට තක්සේරුවක් නිකුත් කරන්න නිසි ක්‍රමවේදයක් නැහැ. එතකොට සමහර වේලාවට අපට දැනගන්න ලැබෙනවා. දුරකථනයෙන් එක එක්කෙනාට කථා කරලා ඒ වේලාවේ ඉඩම්වල යන මිල අහලා

තක්සේරුවක් කරලා, ඒ අදාළ ගාස්තුව බදින්න කියලා කියනවා. මම කියන්නේ, මේ බස්නාහිර පළාත් සභාවට යම්කිසි අදායමක් ලබා ගැනීම වරදක් නැහැ. නමුත් මේ ක්‍රමවේදය ක්‍රියාත්මක වන ආකාරය අනුව ගැටලු රාශියක් මතු වෙලා තිබෙනවා. එක ඉඩමට නිලධාරී කීපදෙනෙක් ක්‍රියාත්මක වන කොට, සමහර විට එක්කෙනෙක් ලක්‍ෂ 50 ක් තක්සේරු කරනකොට, තව එක්කෙනෙක් ලක්‍ෂ 25 ක් තක්සේරු කරනවා. එතකොට ඒ පුද්ගලයින්ට ඉතාම අසාධාරණ තත්ත්වයක් ඇති වෙනවා. මේ ගැටළු ගැන කථා කරන්න ගියපුවාම. අපි හිතමුකෝ බැංකු ණයක් ලබා ගන්න හරි, එහෙම නැත්නම් වෙනත් ව්‍යාපාරයක් ආරම්භ කරන්න හරි දෙයකට ඉදිරිපත් කරන්න විධියක් නැහැ. එහි නිශ්චිත භාවයක් නොමැතිකම නිසා. ඒත් එක්කම නිලධාරීන් ඇවිල්ලා ප්‍රශ්න කරපුවාම, නිලධාරීන්ගෙන් ඇහුවොත් මේ මුල් අවස්ථාවේදීම අපට යොදන්න තිබෙන වටිනාකම දැනුම් දෙනවා නම්, ඒක නොතාරිස්වරුන්ට, නීතීඥවරුන්ට ඉතාම පහසුවක්. අඩුම වශයෙන් යම්කිසි ගමකට ඒ තිබෙන වටිනාකම බලලා දළ වටිනාකමක් අපට නියම කරන්න පුළුවන්කමක් තිබෙනවා. සමහර නිලධාරීන් හිතවත්කමට ඒක අවශ්‍ය නැහැයි කියලා සමහරුන්ව නිදහස් කරලා අරිනවා. තව සමහරුන්ව සුළු ගණනක් අය කරලා නිදහස් කරලා අරිනවා. තව සමහරුන්ට ඉතාම විශාල මුදල් ප්‍රමාණයක් ගෙවන්න කියලා නියම කරනවා. අපි පනවලා තිබෙන නීතිය අයුතු විධියට ක්‍රියාත්මක වීමක් මෙතැන සිද්ධ වෙනවා. මෙය බරපතළ ප්‍රශ්නයක්. නීතීඥවරු රාශියක්, ඒත් එක්කම නොතාරිස්වරු රාශියක් මේ ප්‍රශ්නය ගැන මගේ අවධානය යොමු කරලා තිබෙනවා, සභාවට මේ කාරණාව ඉදිරිපත් කරන්න කියලා. එහිදී නිලධාරීන්ට පුළුවන්කමක් තිබෙනවා, නමුත් පෞද්ගලිකව හඳුනන කෙනෙක් නම් යම්කිසි සහනයක් දෙන්න. එතකොට මේ වැදගත් සභාවක් පනවන නීතිය එක් නිලධාරියෙකුගේ අණසකට යටත් වෙලා ඒ තීන්දුව, තීරණය ඒ තැනැත්තාට ගන්න පුළුවන්කම ලැබෙනවා. සමහර ආදායම් පළාත් සභාවට අහිමි වෙනවා. වෙන කෙනෙකුගේ අතට යනවා. ඉතින් මෙවැනි තත්ත්වයක් යටතේ ක්‍රියාත්මක වන මේ ක්‍රමවේදය ගැන විධිමත් පරීක්‍ෂණයක් කරලා, ඔබතුමා මගින් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අඩුම වශයෙන් දළ වටිනාකමක් නියම කළොත් අපට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්. මේ සභාව ගැන බස්නාහිර පළාතේ ජනතාවගේ තිබෙන විශ්වාසය තහවුරු වෙනවා. මෙහෙම කිසිම වැඩ පිළිවෙළක් නැතුව, ලියුමකින් ගෙන්වනවා. යම්කිසි ලේඛන ටිකක් ගේන්න කියනවා. ඒ නිලධාරියාගේ දැනුම අනුව තමයි තක්සේරුව සිද්ධ වෙන්නේ. අපට ඉන්නවා තක්සේරු කරන්න නිලධාරීන්. එහෙම නිලධාරියෙකුගේ තක්සේරුවක් මේ සඳහා ලබා ගන්නේ නැහැ. සාමාන්‍යයෙන් අලුතෙන් පත්වන නිලධාරියෙක් ඉඩම් ගැන කිසිම දෙයක් දන්නේ නැහැ.

අපි හිතමු ගම්පහ නගරයේ වෙන්න පුළුවන්. මීගමුව නගරයේ වෙන්න පුළුවන්. කිසි දෙයක් දන්නේ නැති කෙනෙක් මිලක් නියම කරනවා. ඒ නියම කරන මිලට කටයුතු කරන්න ඕනෑ. මෙහි ප්‍රබල විසඳිය යුතු ප්‍රශ්න රාශියක් තිබෙනවා. ඒ ගැන ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානය යොමු කරලා විධිමත් සැලැස්මක් යටතේ දළ තක්සේරුවක් සභාවෙන් සියලුම ආයතනවලට නිකුත් කළොත්, ඒ අය මුල් අවස්ථාවේදීම තක්සේරුවට අනුව ලියවිල්ල සැදුවොත් ඒ ආදායම සම්පූර්ණයෙන් පළාත් සභාවට එනවා. එහෙම නැතුව අර පුද්ගලයා කරදරයට පත් වෙනවා. ලිපි ලේඛන අරගෙන කාර්යාලයට එනවා. නිලධාරියා තව දිනයක් දුන්නොත් තව දිනයක එන්න ඕනෑ. සාමාන්‍ය වෙළඳ ගනුදෙනුවලදී ඉතාම අහිතකර තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. ව්‍යාපාරිකයින්ට ඒ වාගේම අනෙකුත් නීතිමය කටයුතු කරන අයට බරපතළ ප්‍රශ්නයක්. මම ගරු සභාපතිතුමා මගින් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. දළ වටිනාකමක් තක්සේරුකරුවන් මගින් මේ සියලුම ප්‍රදේශවලට නිකුත් කරන්න. ඒ හැකියාව අපට තිබෙනවා. එහෙම කළාම විශාල ආදායමක් ලබා ගන්න හැකියාව තිබෙනවා. අප විසින් කරන්න පුළුවන් වැඩක් අපි නොසලකා හැරලා තිබෙන නිසා අවිධිමත් ක්‍රමයකට ක්‍රියාත්මක වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය දිගින් දිගටම සෑම වර්ෂයකම තිබෙන ප්‍රශ්නයක්. නමුත් බස්නාහිර පළාත් සභාව හැටියට ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක් මේ අවුරුද්දේදී ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සකස් කරලා, අවශ්‍ය කරන ප්‍රමාණයට දැන් ළමුන් පාසල්වලට ඇතුළත් කරලා තිබුණත් ජනප්‍රියයි කියන පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම සම්පූර්ණ කරලා නැහැ. එහෙම කරන්න හේතුව වෙලා තිබෙන්නේ, බාධා වෙලා තිබෙන්නේ මධ්‍යම රජය මගින් එහෙම නැත්නම් ආරක්‍ෂක අමාත්‍යාංශය මගින් උවමනා කරන අවසරය තවම ලබා දීලා නැති බවයි අපේ දැන ගැනීම. එහෙම වෙන්නේ ක්‍රියාන්විත රාජකාරීවල යෙදෙන අයගේ දරුවන්ව මේ පාසල්වලට ඇතුළත් කිරීම සඳහා එවන නාම ලේඛනය මම හිතන්නේ, මේ වනතුරුත් එවලා නැහැ. දැන් මේ 2013 අවුරුද්දේ පළමුවැනි වාරය අවසන්.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක එවලා තිබෙනවා. සංශෝධනය වෙන්න ඕනෑ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දරුවා පාසලට දාන්න –

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කොහොම වුණත් (බාධා කිරීමක්) මාමා පළාත් සභා මන්ත්‍රී වුණාම දරුවාව දා ගන්න කාට වුණත් අයිතිවාසිකමක් තිබෙනවා. ඒකත් දීලා තිබෙන්නේ මෙරිල් මන්ත්‍රීතුමාට තමයි. ඉතින් ඒක නිසා ගරු සභාපතිතුමනි, මම මේ කියන්නේ අපේ

පළාත් සභාවේ ක්‍රමවේදය හරි. අපේ පළාත් සභාවේ ඒ පිළිබඳව ගැටළුවක් නැහැ. ඒක හරියට ක්‍රියාත්මක වෙනවා. නමුත් ගැටළුව තිබෙන්නේ මධ්‍යම රජයෙන් ඒ එවන චක්‍රලේඛ හරි, එහෙම නැත්නම් ඒ දෙන උපදෙස් හරි, ඒ දෙන අවසරය හරි නිසි වෙලාවට නොලැබීම නිසා සම්පූර්ණ වාරයක් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට නැතුව යනවා. දැන් බලන්න මේ පළමුවැනි වාරේ [ ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ]

විවිධ ක්‍රියාකාරකම්වල දරුවෝ යෙදෙනවා. ඒ වාරය සම්පූර්ණයෙන්ම අයින් වෙනවා. දැන් ගරු ප්‍රධාන ඇමැතිතුමා පසුගිය කාලේ ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරලා තිබුණා, එහෙම දරුවෝ ඉස්කෝලවලට ඇතුල් වෙලා නැතුව ඉන්නවා නම් දැනුම් දෙන්න කියලා. හැබැයි, එහෙම දැනුම් දුන්නා කියලා දාන්නේ, පළාත් සභාව යටතේ තිබෙන අපි ජනප්‍රියයි කියලා කියන පාසල්වලට නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජනප්‍රිය නොවන.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ජනප්‍රිය නොවන පාසල්වලට තමයි දාන්නේ. නමුත් මේ සෑම දරුවෙක්ම හැම දිස්ත්‍රික්කයකම, හැම කලාපයකම, හැම කොට්ඨාශයකම ජනප්‍රියයි කියන පාසල්වලට යන්න තමයි බලාගෙන ඉන්නේ. ඒකේදී ඇත්තටම පාඩුව විඳින්නේ බස්නාහිර පළාත ඇතුළේ ඉන්න දරුවෝ. හැබැයි මේකේ වරද තිබෙන්නේ මධ්‍යම රජයේ. ඒ නිසා මේක සාකච්ඡා කරලා කරන්න ඕනෑ වැඩක්. මම හිතන්නේ, දෙසැම්බර් 31 වනකොට මේ කටයුත්ත අනිවාර්යෙන් ඉවර කරන්න පුළුවන් තත්ත්වයක තිබෙනවා. බොහොම පැහැදිලිව තිබෙනවා. ක්‍රියාන්විත රාජකාරීවල කියලා යුද්ධය තිබුණු කාලේ ඉඳලා, ඒක ගැන පොඩි අවස්ථාවක් අපට දෙන්න තිබුණා. දැන් එහෙම තත්ත්වයක් රටේ නැහැ. එතකොට ඇත්ත වශයෙන්ම අයදුම් පත් කැඳවන්නේ මැයි මාසේ, ජුනි මාසේ, ජූලි මාසේ විතර. සම්මුඛ පරීක්ෂණ තියලා ඉවර වෙලා සැප්තැම්බර්, ඔක්තෝබර් වනකොට මේ නාම ලේඛන සකස් කරන්න පුළුවන්. ඒ නිසා මම කියන්නේ, දෙසැම්බර් 31 වනකොට මේක සම්පූර්ණයෙන් ඉවර කරගන්න පුළුවන් විධියට මේ සභාව හරහා - මේ ප්‍රධාන ඇමැතිතුමා, අපි ගත්තු ක්‍රියා මාර්ගයම, මධ්‍යම රජයේ ඉතාමත් ඉහළ තත්ත්වයක ඉන්න, අධ්‍යාපනය ගැන අකනිට්ටාවටම දන්න අධ්‍යාපන ඇමැතිතුමාට මේක යොමු කළා නම් එහෙම, මේ ප්‍රශ්නය මෙපමණ කල් ඇදෙන්නේ නැහැ. මේ තත්ත්වය ලබන අවුරුද්දට තියා ගන්න එපා. ඒකයි මම කියන්නේ. අප්‍රේල් මාසේ ඉවර වෙලා මැයි මාසේ ඊළඟ වාරය පටන් ගන්නකොටම අඩුම ගණනේ ළමයින්ට මේ පාසල්වලට යන්න පුළුවන් වන විධියට මේ තත්ත්වය, වාතාවරණය සකස් කරලා දෙන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ සඳහා අවස්ථාවක් ලබා දීම පිළිබඳව. මම හිතන්නේ, මම අවුරුදු ගණනාවක් මේ ප්‍රශ්නය ගැන මේ සභාවේ කථා කරනවා. අපට විතරක් තනිවම විසඳුමක් දෙන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මෙය මධ්‍යම රජයෙන් පිළිතුරු ලැබිය යුතු ප්‍රශ්නයක්. මේක කොලොන්නාව ජනතාවට වෙලා තිබෙන විශාල අසාධාරණයක් බව මම හැමදාම කියනවා. මොකද, කොළඹ නගර සභාව කියන්නේ, මහ විශාල බල ප්‍රදේශයක් තිබෙන සුපිරි ආයතනයක්. ඒකට ජනතාවගේ බදු, ව්‍යාපාරිකයින්ගේ බදු මේ වාගේ දේවල් විශාල වශයෙන් ලැබෙනවා. ඒ වාගේම මම දන්නවා. පසුගිය වකවානුව තුළ මේ කුණු ප්‍රශ්නය විසඳන්න නිලධාරීන් සිය ගණනක් රජයේ මුදල් පාවිච්චි කරලා, ඒ ආයතනයේ මුදල් පාවිච්චි කරලා කසළ කළමනාකරණය ගැන ඉගෙන ගන්න පිටරටවල ගිහිල්ලා තිබෙනවා. නමුත් අද වනකල් මේ ප්‍රශ්නයට විසඳුමක් නැහැ. කොලොන්නාවේ ජනතාව විතරක් නොවෙයි, අපත් ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. හැබැයි, අපි මේ ගැන කථා නොකර ඉඳලා නැහැ. දැන් පසුගිය කාලේ කවුදෝ අලුත් කොටසක් බොහොම වෛරය පෙරදැරි කරගෙන මතු වෙලා, ඒ ජනතාව ආක්‍රමණය කරගෙන දේශපාලඥයෝ එන්න එපා කියලා හඬක් ගෙනියනවා. මම නම් දන්න හැටියට නිලධාරීන්, දේශපාලඥයන් කියන දෙපිරිස එකතු වෙන්නේ නැතුව කවදාවත් රටේ ප්‍රශ්නයකට පිළිතුරු සොයන්න බැහැ. ඒක මාධ්‍යයත් උළුප්පලා සමහර වෙලාවට වැරදි විධියට ප්‍රචාරය කරනවා. මාධ්‍ය ගැන මම කථා කරන්න යන්නේ නැහැ. මොකද, මගේ තාත්තා අවවාදයක් දීලා තිබෙනවා, මාධ්‍ය එක්ක හැප්පෙන්න එපැයි කියලා. හැබැයි, යථාර්ථය මාධ්‍යයට වඩා ඉස්සර වෙලා ගිහිල්ලා මිනිස්සු ඇත්ත සොයා ගන්නවා කියන විශ්වාසය මට තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ කුණු කන්ද පිළිබඳව මතක් කරන කොට වීරසිංහ මල්ලිමාරච්චි මැතිතුමාගේ කාලේ තමයි ඉස්සෙල්ලාම ඇති වුණේ. 1994 බලයට පත් වුණාට පස්සේ බෙනට් කුරේ මහත්මයා මේක අවසන් කළා. ඒ විතරක් නොවෙයි. එතුමා මේකට හොඳ සංවර්ධන යෝජනාවලියක් ගෙන ආවා. අක්කර 2 1/2 ක් නගර සභාවේ කුණු ඉවත් කරන්න තියලා, ඉතිරි ඉඩමේ ලොකු නිවාස යෝජනා ක්‍රම දෙකක්, එකක් මධ්‍යම පාන්තික නිවාස යෝජනා ක්‍රම. ඒක විකුණලා ඒ ලැබෙන සල්ලිවලින් ඔය පාරවල් පළල් කරන කොට, පාරවල් කැඩෙන කොට ඒ වාගේ තැන්වල ඉන්න අනවසර පදිංචිකරුවන්ට ලස්සනට ජීවත් වෙන්න පුළුවන් නිවාස ක්‍රමයකට මුල්ගල තිබ්බා. ඒ වාගේම Swimming Pool එකක් වාගේ සැලසුම් ගොඩක් තිබුණා. නාගරික සංවර්ධන අධිකාරියේ අද ඒ විධියටම ඒවා තිබෙනවා. ඒ වාගේම නැවත වරක් උසාවිය නියෝගය දුන්නේ, අක්කර 2 1/2 ක විතරක් කුණු දාන්න. නමුත් අද ඒ මුළු ඉඩමේම කුණු දාලා මුළු පරිසරයම ගඳ ගස්සන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අපි මේ පිළිබඳව විරෝධය දක්වලා හැම තැනම කථා

කළා. උසාවි නියෝගයක් කියලා එවකට තිබුණු නගර සභාව මේකට අත ගහන්න බය වුණා. නමුත් අපි නිකම් හිටියේ නැහැ. අපි මේ පිළිබඳව දැඩි මතයක් ගෙන ගියා, මේක වහාම ඉවර කර ගන්න කියලා. ඒ වාගේම ඊට පස්සේ අපට ආරංචි වුණා විදුලි ව්‍යාපෘතියක් මෙතැනට එනවා කියලා. අපි ඒ ගැන හොයලා බලන කොට, විද්වත් දායකයින්ගෙන් අහන කොට, වෙබ් එකෙන් කරුණු හොයන කොට අපට මේකත් මහ භයානක ප්‍රශ්නයක් හැටියට පේන්න තිබුණා. මොකද, ඒ විදුලි ව්‍යාපෘතියේ විමිනියේ උස කොලොන්නාව නගරයේ ගාණට තිබෙන්නේ. මම මේ සභාවේදී ඒ ගැන කථා කරලා හැන්සාඩ්වල සඳහන්ව තිබෙනවා. ඒ දුමාරය ප්‍රදේශය පුරා පැතිරෙන කොට ඉස්කෝල දහයක් පහළොවක් වහන තත්ත්වයකට පත් වෙනවා. ඒක නිසා පරිසර අධිකාරියට අපි බල කරලා, ලියුම් ලියලා ඒ වාගේ විශාල වැඩ කොටසක් කරලා ඒ විදුලි ව්‍යාපෘතිය නවත්වන තත්ත්වයට අපි කටයුතු කළා. ඒ වාගේම අවට ජනතාවට ලියුම් 400 ක් විතර බෙදලා මේ පිළිබඳව අපි දැනුවත් කළා. හැබැයි කනගාටුයි. මිනිස්සුත් යකා තමන්ගේ ගෙට එනකොට තමයි පිබිදෙන්නේ. අල්ලපු ගෙදරට ආවත් මිනිස්සු ගණන් ගන්නේ නැහැ. ඒ වෙලාවේ 25 දෙනෙක් විතර තමයි ආවේ. ඒක සංවිධානය කළේ කොලොන්නාව නාගරික මන්ත්‍රී සාලිය වික්‍රමසිංහ මැතිතුමා. එතුමා ඒ වෙලාවේ මේ පිළිබඳව හොඳ දැනුමක් තිබෙන පරිසරවේදී රීසා යෙහියා මහත්මයත්, ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය ඉනෝකා මෙන්ඩිස් යන මේ දෙදෙනාවම ගෙන්නුවා. ඔවුන් ලවා මේ විදුලි ව්‍යාපෘතියෙන් ජනතාවට වන අසාධාරණය පිළිබඳව අර හිටපු පිරිස දැනුවත් කළා. රෝග බෝ වන හැටි. ක්ෂය රෝගය වැඩි වෙන හැටි. මේ හැම එකක්ම කරලා අද අපි මේක නවත්වන තත්ත්වයට පත් වුණා. අපි මුකුත් කරලා නැහැයි කියලා තමයි අර අලුත් කණ්ඩායම හැම තිස්සේම කෑගහන්නේ. මම මේ සභාවේදීම කථා කරලා තිබෙනවා. 2012.02.21, 2012.06.07, 2012.06.19, 2012.08.07 මට මේ හොයා ගන්න පුළුවන් වුණු හැන්සාඩ් විතරයි. මීට වැඩිය මම කථා කරලා තිබෙනවා. තමුන්නාන්සේලාට මතක ඇති ගියවර පළාත් සභා අයවැයේදීත් මම කිව්වේ, මේ කුණු කන්දෙන් අපව නිදහස් කරන්න කියලා. මේක පළාත් සභාවට විතරක් විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නම් මම දන්නවා අපේ ඇමැතිතුමා තමුන්නාන්සේලා අපි පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව එකතු වෙලා අපට මේක ඉවර කරන්න තිබුණා. නමුත් මේක ඉවර කරන්න අපට බැහැ. මේක ඉවර කරන්න පුළුවන් කොළඹ නගර සභාවට. කොළඹ නගර සභාව මේ කුණු ටික අපට පටවලා ඒගොල්ලෝ නිදහස් වෙන්න තමයි හැම තිස්සේම බලන්නේ.

ගරු සභාපතිතුමනි, පසුගිය දවස්වල ඔය කුණු කන්ද ඇළට කඩා වැටුණා. අපේ වතු කිහිපයක්, දහම්පුර, 101 වත්ත, 23 වත්ත මේකෙන් යට වුණා. කුණු හේදිලා ආපු ජරා වතුර මේ ගෙවල්වල විසිරිලා ගියා. සාලිය වික්‍රමසිංහ මැතිතුමා මාවත් දැනුවත් කරලා, අපි UDA එකට කථා කරලා, පහත් බිම් එකට කථා කරලා, කොළඹ නගර සභාවට කථා කරලා බොහොම අමාරුවෙන් අවශ්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර ගෙනැල්ලා මේවා හාරලා වතුර බහින්න සැලැස්සුවා විතරක් නොවෙයි. මම මගේ විමධ්‍යගත මුදල් වියදම් කරලා කාණුත් හදලා දුන්නා. පසුගිය දවස්වල ප්‍රජා ශාලාව කඩාගෙන වැටුණා. ග්‍රාම නිලධාරී කාර්යාලය කඩා වැටුණා. ගමකට එක වැඩක් යටතේ මම ඒවා ඔක්කෝම හදලා දුන්නා. ඒ වාගේම ගංවතුරක් ගැලුවත්, මොන දේ වුණත් මම සහ සාලිය වික්‍රමසිංහ මන්ත්‍රීතුමා තමයි ඉස්සෙල්ලාම එතැනට යන්නේ. අපි ඒ කරපු වැඩ ඔක්කෝම පැත්තකට දාලා අලුතෙන් ඉස්මතු වුණු මිනිසුන්ගේ දුක විකුණන බංකොලොත් කණ්ඩායමක් දැන් අලුත් දෙයක් කියලා අපට එන්න දෙන්නෙත් නැහැ. අපට කථා කරන්න දෙන්නෙත් නැහැ. අපි කථා කරන්න ගියාම අපේ කථා ඕනෑ නැහැ. ඔයගොල්ලෝ බොරුවට දැන් තැන ගන්න හදනවා. තැන ගන්න අශෝකා ලංකාතිලකට කුණු විකුණන්න ඕනෑ නැහැ. අශෝකා ලංකාතිලක කවුද කියලා දන්න නිසා තමයි මිනිස්සු කවදාවත් මාව පරද්දන්නේ නැතුව හැමදාම ප්‍රාදේශීය සභාවෙන් පළාත් සභාවට ගෙනැල්ලා පස් පාරක් ඡන්දය ඉල්ලපු මාව ජයග්‍රහණය කරවලා තිබෙන්නේ. මම මිනිස්සුන්ගේ දුක විකුණන ගෙන කන තත්ත්වයක පවතින්නේ නැහැ. නමුත් ඒ කණ්ඩායම් පත් වෙලා තිබෙන්නේ ඒ තත්ත්වයට. මටත් මේක දුකක්. මමත් ඒ ගමේ ඉපදුණු කෙනෙක්. දැන් මෙගොඩ කොලොන්නාවේ පදිංචි වෙලා හිටියාට. ඒක නිසා මටත් දැනෙනනවා තද වැස්ස වෙලාවට අපේ ගෙවල්වලට පවා මේ දුර්ගන්ධය එනවා. ඒ ආවත් නාවත් මිනිස්සුන්ගේ දුක අපට පේනවා. ඇත්තටම දැන් ගෙවල් ගිලා බැස්සා. ඒවට ගෙවල් දෙන්න, ඒ දෙන ඇඩ්වාන්ස් එක වැඩි කරලා දෙන්න, අපි ඉහළ ආයතනත් එක්ක කථා කළා. එසේ කථා කරලා, ප්ලැට් එකක් හදලා අද ඒ අයව පදිංචි කරවනකල් ඔවුන්ට ගෙවල් කුලියක් දෙනවා. මේ වාගේ විශාල වැඩ කන්දරාවක් අපි මේ වෙනුවෙන් කරලා තිබෙනවා. නමුත් මම කනගාටු වෙනවා. මම බය නැතුව කොළඹ මහ නගර සභාවට ඇඟිල්ල දික් කරනවා. ඒ වාගේම රජයට. රජයත් මේ වාගේ දේවල්වලට විසඳුම් දෙන්න මීට වඩා කාරුණික වෙන්න ඕනෑ කියන එක මම විශ්වාස කරනවා. කොළඹ නගරය ලස්සන කරනවාට අපි විරුද්ධ නැහැ. අපි හරි ආසයි කොළඹ නරගය ලස්සනට තියෙනවාට. ඒ වාගේම කොලොන්නාව නගරයේ ජීවත් වන ජනතාව ලස්සනට ජීවත් වෙන්න කැමැතියි. සෞඛ්‍ය සම්පන්නව ජීවත් වෙන්න කැමැතියි. සහනයෙන් ජීවත් වෙන්න කැමැතියි. ඒ නිසා මේ ප්‍රශ්නය කුළියට ගන්න මිනිස්සු නොවෙයි අපි. ප්‍රශ්නවලට යථාර්ථවාදීව පිළිතුරු හොයලා අපේ රජයක් තිබුණත් අපි ඒකට විසඳුම් සොයන්න ඒ අයත් එක්ක හැප්පිලා හරි ප්‍රයෝජනය ලබා දෙන්න කැමැති කෙනෙක්.

පසුගිය අවුරුද්දේ අතිගරු ජනාධිපතිතුමා කොළඹ සංවර්ධන කමිටුව පටන් ගත්තු වෙලාවේත් මම ඒ වෙනුවෙන් ඒ සභාවේදී ජනාධිපතිතුමා එක්ක කථා කළා. ජනාධිපතිතුමාට මේ පිළිබඳව බල කිරීම් කළා. හැබැයි ප්‍රශ්නයකට විසඳුම් එක පාරටම දෙන්න බැහැ. දැන් ඒවාට විසඳුම් සොයාගෙන වැඩ පිළිවෙළවල් යනවා. නමුත් මම මහ නගර සභාවට කියන්නේ, තමුන්නාන්සේලාගේ බදු ගෙවන ජනතාව විතරක් නොවෙයි කුණු නැතුව ජීවත් වෙන්න

කැමැති. කොලොන්නාවේ ජීවත් වන අහිංසක මිනිස්සුත් කැමැතියි පිරිසිදුවට, ලස්සනට ජීවත් වෙන්න. අපේ එක පාසලක් තාවකාලිකව වහන්න සිද්ධ වුණා. දැන් ලබන වාරයේදී අපි ඒක අරින්න සූදානම් කරලා තිබෙනවා. ඒක නිසා කොලොන්නාවේ මේ තිබෙන ප්‍රශ්නයට කාටවත් මුල් වෙන්න එපා කියලා මම කියන්නේ නැහැ. මේකට මුල්වන හැම කෙනෙකුටම මම ගරු කරනවා. නමුත් ඒකේ මානුෂික මුහුණුවරක් තිබෙන්න ඕනෑ.

[ ගරු අශෝකා ලංකාතිලක ]

ඒ ප්‍රශ්නයට විසඳුම් දෙන්න සියල්ල එකතු වෙන්න ඕනෑ. මම ඒ සියලු දෙනාටම කියනවා මේකට සංවාදයක් ඇති කරගන්න. මේ කුණු ඉවත් කරන්නේ කොහොමද? මේවා කොහාට හරි ගිහිල්ලා දාන්නේ කොහොමද? කිසිම ප්‍රදේශයක ජනතාවකට හානියක් නොවන ආකාරයෙන් මේකට විසඳුම් දෙන්නේ කොහොමද කියලා කියන්න. එහෙම නැතුව හොඳට ඉන්න දේශපාලඥයින්ට මඩ ගහන්න මේක ව්‍යාපාරයක් කර ගෙන මිනිසුන්ගේ දුක විකුණන්න එපා කියන එක මම ඒ සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා. ඒ අයගෙන් මම ඉල්ලා සිටිනවා. හරි අපි සාකච්ඡා කරමු. අපි මේවාට විසඳුම් හදමු. අපි මේ විසඳුම් ක්‍රියාත්මක කරලා මේ ප්‍රශ්නයෙන් නිදහස් වෙන්න එකමුතු වෙමුයි කියන එක මම සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිමින්, කොලොන්නාවේ ජනතාවට කුණුවලින් තොරව ජීවත් වීමට, නිදහසේ හුස්ම ගන්නට අවස්ථාව ඉක්මණින් සැලසේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, *"2013.03.19 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළැඹුණු එකඟතාවයට අනුව, අද දින (2013.04.09 දින) විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2013.05.07 වන දින පෙ.ව.09.30 ට රැස් විය යුතු අතර 2013.04.23 දිනය (අඟහරුවාදා දින) සභා රැස්වීම නොපැවෙත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතුය" යන යෝජනාව ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි,*"2013.03.19 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම සභාව 2013.04.09 දින විසිර යෑමෙන් අනතුරුව 2013.05.07 දින රැස් වීමට එකඟතාවය පළ වූ හෙයින්ද 2013.03.27 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවය මත අද දින (2013.04.09) න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂය යටතේ අංක 04 හි සඳහන් වැඩ කටයුතු අද දින තුළදීම නිම කිරීමට එකඟතාවය ලද හෙයින්ද, එම වැඩ කටයුතු කෙරෙහි රීති අංක 57(1), 57(4), 57(5) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය." යන යෝජනාව ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදි මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.15 ට යළිත් රැස්විය.***
*Sitting, accordingly suspened untill 11.15 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු යටතේ පළමු යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු ප්‍රධාන ඇමැතිතුමාට අවස්ථාව.

# විවාහ ලියාපදිංචි කිරීමේ [සංශෝධන] පනත් කෙටුම්පත : පළාත් සභාවේ අදහස් විමසීම
REGISTRATION OF MARRIAGES (AMENDMENT) BILL: EXPRESSION OF PROVINCIAL COUNCIL

**ගරු ප්‍රසන්න රණතුංග** – ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත" ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 5 (අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් 2013 අප්‍රේල් මස 11 වන දිනට හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, 46 අ (2) අ වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ දන්වා ඇති හෙයින් හා එම දැනුම් දීම 2013.03.19 වන දින පැවැති බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා රැස්වීමේදී නිවේදනය කර*

*ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදුව, එම කාරක සභාවේ වාර්තාවද ලැබී ඇති හෙයින් ඒ පිළිබඳවද සැලකිලිමත්ව, යථෝක්ත පනත් කෙටුම්පත පිළිබඳව තවදුරටත් මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළැඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව -

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. දැන් විවාහ ලියාපදිංචි කිරීමේ ගාස්තු සංශෝධනයත් එක්කම 2013 ජනවාරි මස 02 වැනිදා සිට ක්‍රියාත්මක වෙනවා කිව්වාට ඒ ගාස්තු දැනුත් ක්‍රියාත්මක කිරීම කරගෙන යද්දී, අපේ සභාවට යොමු කිරීම මගින් දැන් මොකක්ද බලාපොරොත්තු වෙන්නේ? දැනටමත් මෙය ක්‍රියාත්මක වෙනවා නේ? දැනටමත් මේ චක්‍රලේඛය තුළ බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් විවාහ රෙජිස්ටාර්වරුන්ට දැනුම් දීලා තිබෙනවා, 2013 ජනවාරි 01 වැනිදා සිට ක්‍රියාත්මක වෙන්න කියලා. වර්තමානයේ මෙය ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එතකොට මේ සභාව හැල්ලු කිරීමක්ද මේ සිද්ධ කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ සභාව හැල්ලු කිරීමක් නොවෙයි ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ක්‍රියාත්මක වන දෙයක් අපි සභාවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවෙන් පළාත් සභාවේ කැමැත්ත විමසනවා. අපට අපේ අදහස් පාර්ලිමේන්තුවට ලබා දෙන්න පුළුවන්.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මේකෙන් බලාපොරොත්තු වෙන්නේ -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අපට තිබෙන්නේ අනුමැතිය දෙන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

අපේ අනුමැතිය නැතිව ක්‍රියාත්මක වෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මේක ගියවර අයවැය යෝජනාවලට ආපු යෝජනාවක්. පාර්ලිමේන්තුවට.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

දැනට මේක ක්‍රියාත්මක වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් අයවැයට ආපු යෝජනාවක් මේක. ඒක ප්‍රශ්නයක් නැහැ. අයවැය සම්මත වුණා නේ? ඒ අනුව පාර්ලිමේන්තුවට මේක ක්‍රියාත්මක කරන්න පුළුවන්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේක පසුගිය අයවැයේදී යෝජනාවක් හැටියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණු කාරණාවක්. ඒ වාගේම මේ කාරණාව සමගාමී ලැයිස්තුවේ තිබෙන ක්‍රියාවලියක් නිසා තමයි පළාත් සභාවට යොමු කරලා තිබෙන්නේ. ඒ නිසයි අද සාකච්ඡාවට ගන්න බලාපොරොත්තු වෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, ගාස්තු වැඩි කිරීම පිළිබඳව එකඟ වෙන්න බැහැ. මොකද, මේක කාන්තාවන්ගේ තිබෙන අයිතියක්. විවාහය ලියාපදිංචි කිරීම, විවාහ සහතිකය කියන එක කාන්තා පාර්ශවයෙන් වියදම් කරන්න ඕනෑ දෙයක්. දැන් අපි නියෝජනය කරන දිස්ත්‍රික්කය දිහා බැලුවොත්, ගෙදරට වාහනයක් ගේන්නවත් බැරි ග්‍රාමීය ජනතාව හරියට ඉන්නවා.

[සභාවේ ඝෝෂා]

විවාහ ලියාපදිංචි කිරීමේ සහතිකය ලබා ගැනීමේ අයිතිය තිබෙන්නේ කාන්තාවට. ඒ කාන්තාව ආරක්ෂා කිරීම සඳහා තමයි මේ විවාහ රෙජිස්ටර් කිරීම අවශ්‍ය වෙලා තිබෙන්නේ. ඒ සහතිකය ලබා දෙන්නේ කාන්තාවට. කාන්තා පාර්ශවය මේකෙන් නියෝජනය වෙන්නේ. එතකොට අපේ ගම්වල ඔබතුමාත් නියෝජනය කරන ආසනයේ ගෙදරට එන්න බැරි පාරවල් තිබෙන්නේ. අඩි 6, 7 පොඩි පාරවල් තිබෙනවා. එතකොට විවාහ රෙජිස්ට්‍රාර්වරයා වෙනත් නැද්ද ගෙදරකට හරි ගෙනැල්ලා විවාහයක් සිද්ධ කරන්න ගියොත් රුපියල් 5000 ක් ගෙවන්න සිද්ධ වෙනවා. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, ඉස්සර

ගමක නායක හාමුදුරුවෝ, ගම්මුලාදෑනියා, වෙද මහත්මයා, රෙජිස්ටාර්වරයා, විදුහල්පතිවරයා කියන්නේ වැදගත් පුද්ගලයෝ. අද මේ අය සල්ලිවලට ගන්න කට්ටියක් බවට පත් වෙලා තිබෙනවා. රුපියල් 750 ක් නැත්නම් කසාද බඳින්න යන්න විධියක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම එකක් මෙතැන කියලා නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මේකේ තියෙනවා එහෙම එකක්. ෆෝම් එකක් ලබා දෙන්නත් රෙජිස්ටාර්වරයා රුපියල් 100 ක් ගන්නවා. එතකොට ෆෝම් එක භාර දෙන්න රුපියල් 200 ක් ඕනෑ. අපේ පියනන්ද හාමුදුරුවෝත් මෙතැන වැඩම කර සිටිනවා. ඔහොම ගියොත් දැන් හෙට අනිද්දා වනකොට පිරිතක් කියන්නත් මෙපමණ ගන්නවා කියයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙන කාරණයක් ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතකොට කියයි දානෙකට හාමුදුරුවෝ කෙනෙක් වඩම්මන්නත් මෙපමණයි කියලා. ලංකාව ලෝක ඉතිහාසයේ -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, නිකම් විවාහ වෙන්න බැහැ. විවාහ වෙනකොට මනාලියට ඇඳුම් පළඳවන්න ඕනෑ. මාල දාන්න ඕනෑ. පෝරුවට නගින්න ඕනෑ. අෂ්ඨක කියන්න ඕනෑ. එතකොට මේ විවාහයක් රෙජිස්ටර් කරනකොට ඒකට ලිපි ගොනුවකුත් අවශ්‍යයි. මේ ලිපි ගොනුවටත් වියදමක් තිබෙනවා. සුද්දාගේ කාලේ ගෙනාපු නීතියක් අද සංශෝධනය කරලා තිබෙනවා. ඒකයි කරලා තිබෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, මෙතුමා කියන්නේ තරු පහේ හෝටල්වල තිබෙන මඟුල් ගෙවල් ගැන. ගමේ ගෙදරට එන්න පාරක් නැතුව පොල් අතු ගෙයක් තිබෙන මනුස්සයෙක් තමුන්ගේ විවාහ මංගල්‍යය කරන්න හෝටලයකට ගියාම, නැත්නම් නෑදෑ ගෙදරකට ගියාම වන සිද්ධිය ගැනයි අපි මේ කථා කරන්නේ. තරු පහේ හෝටල්වල කරන මඟුල් ගෙවල් ගැන නොවෙයි අපි කථා කරන්නේ. මේක සම්මත වුණොත් කසාද බඳින්න රුපියල් 5700 ක් ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම එකක් නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මිලක් නියම කරලා නැත්තේ මොකද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඕක කියවන්න. එහෙම දෙයක් නැහැ. බොරු ප්‍රකාශ කරන්න එපා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මේකේ තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කොළය නොවෙයි. මේ සංශෝධන කෙටුම්පතේ කොහේවත් එහෙම කියලා නැහැ. ඔබතුමා බොරු ප්‍රකාශ කරලා සභාව නොමඟ අරින්න එපා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

රෙජිස්ටාර්වරයා රුපියල් 750 ක් අය කරන්නේ නැද්ද -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, ඒ වගන්තිය එතුමාට කියවන්න ඉඩ දෙන්න කෝ?

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

එතුමා කියවලා නැහැ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නැහැ, නැහැ. මම කියවලා ඇවිල්ලා තියෙන්නේ. මේකට සමගාමීව රෙජිස්ට්‍රාර්වරුන්ට චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. ඒ රෙජිස්ටාර්වරුන්ගේ චක්‍රලේඛයේ තිබෙනවා, ඔහුගේ කර්යාලයේදී හෝ වෙනත් ස්ථානයක විවාහ දැන්වීමක් ඇතුළත් කිරීමට රෙජිස්ටාර්වරයාට අයදුම්කරු ගෙවන්න ඕනෑ රුපියල් 100 ක්. මීට පෙර තිබුණේ රුපියල් 5 ක මුද්දරයක් ගහන්න. දැන් රුපියල් 5 මුද්දරය වෙනුවට රුපියල් 100 ක් අය කරනවා. ඔහුගේ කාර්යාලයේ විවාහය සිදු කිරීමට රෙජිස්ට්‍රාර්වරයා සල්ලි ගන්න ඕනෑ. රුපියල් 750 ක්. ඊට පෙර තිබුණේ රුපියල් 200 ක් කියලා. ඒකත් කැමැති නම් දෙන්න. දැන් මේ මුදල් අය කිරීම තුළ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා රුපියල් 5000 ක් කිව්වේ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, මේක හැන්සාඩ් එකෙන් කපා හරින්න ඕනෑ. රුපියල් 5000 ක් කියපු එක.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

25 (1) යටතේ ඔහුගේ කාර්යාලයෙන් පිටතදී විවාහයක් සිදු කිරීම. රෙජිස්ට්‍රාර්වරයා රුපියල් 1500 යි. රජයට 3500 යි. රුපියල් 5000 හැදිලා තිබෙන විධිය. මම කියන්නේ මේකත් එක්ක සමගාමීව චක්‍රලේඛයක් නිකුත් වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටුම්පතේ නැහැ ගරු මන්ත්‍රීතුමා. කෙටුම්පතේ එහෙම ප්‍රකාශයක් -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේ පනතේ තුන්වැනි සහ හතර වැනි පිටුවලට. මේක පොඩ්ඩක් බැලුවොත් අවධානයට එයි. ඒකේ කිසිම අවස්ථාවක රුපියල් 5000 ක් අය කරන එකක් කියලා නැහැ. ගෙවීම් ගාස්තු පිළිබඳව තුන සහ හතරේ තිබෙනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාට මම පැහැදිලි කරන්නේ. මේක සමගාමීව චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. මොකද අපි මේක සම්මත කරනකොට චක්‍රලේඛයත් Automatically අනුමත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි අද සම්මත කරන්නේ කෙටුම්පත විතරයි. සභාවේ එකඟතාවය ගන්නේ කෙටුම්පතට. මේ කෙටුම්පතේ කොහේවත් මේ සංශෝධන ගැන කියලා නැහැ. රුපියල් 1500 ක් කියලා තිබෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මේකට සමගාමීව ඉදිරිපත් කරපු මේ චක්‍රලේඛය මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අපට ලැබිලා නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, දැනට ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් තමයි අපි අද අනුමත කර ගන්න යන්නේ. ඔබතුමා දන්නවා දිවි නැඟුම පනත ගෙනාපු වෙලාවේ දිවි නැඟුම පනතට සංශෝධන ඉදිරිපත් කළාට පස්සේ තමයි නැවත පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තේ. නමුත් දැන් මේ ක්‍රියාත්මක වන යෝජනාවකට නැවත පළාත් සභාවේ අනුමැතිය ඉල්ලනවා. ඇත්තටම මේක විහිළු සහගතයි. මේ කරන වැඩෙත් එක්ක අද දවසේ කාලයත් අපරාදේ. දැන් මේක ක්‍රියාත්මකයි. ක්‍රියාත්මක වන යෝජනාවකට අපේ අනුමැතිය මේ සභාවෙන් ඉල්ලන එක පළාත් සභා ව්‍යුහය අනුමත නොකරන මන්ත්‍රීවරයෙක් හැටියට වුණත් සභාව හැල්ලුවට පත් කිරීමක් කියලා මම නම් විශ්වාස කරනවා. මෙතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සාමාන්‍යයෙන් 154 උ 5 යටතේ පළාත් සභාවේ මතයත් විමසනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඔබතුමා ඉදිරිපත් කරන කාරණාව හරි. ඔබතුමා සභාපතිවරයා හැටියට ඔය කාරණය ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ ඔබතුමාගේ රාජකාරිය. නමුත් අපි විශ්වාස කරන විධියට කොහොමත් අපි පළාත් සභා අනුමත නොකළත්, පළාත් සභා ව්‍යුහය හැල්ලු කිරීමක් හැටියට අපි දකිනවා. මොකද, මේ වනකොට මෙය ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් බවට පත් වෙලා තිබෙනවා. දිවුරුම් ප්‍රකාශ ගාස්තු රුපියල් 25 සිට රුපියල් 250 දක්වා වැඩි වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, ගරු මන්ත්‍රීතුමා 2012 අයවැය යෝජනාවේදී පාර්ලිමේන්තුවේ සම්මත වුණු යෝජනාවක්. ඒක ක්‍රියාත්මක වෙනවා. අයවැය සම්මත නම් ක්‍රියාත්මක වෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

පළාත් සභාවෙන් වැඩක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සම්ප්‍රදායක් වශයෙන් මේ පළාත් සභාවේ මතය විමසනවා. ඒකයි කරන්නේ.

**ගරු සරත් පතිරණ**

Hon. Sarath Pathirana

දැන් පළාත් සභා වැඩක් නැහැ. මධ්‍යම රජයෙන් ක්‍රියාත්මක වෙලා තීන්දු තීරණ ටික අරගෙන ක්‍රියාත්මක කළා. ඒ නිසා පළාත් සභාවේ කරුණු විමසීමට හේතුවක් නැහැ. පළාත් සභාව මන්ත්‍රීවරුන් පුහුණු ආයතනයක් හැටියට තමයි තිබෙන්නේ. අපි මුල ඉඳලාම කියපු දේ දැන් ඔප්පු වෙමින් තිබෙනවා. ඒ නිසා කොහොමත් මේ වෙලාවේ දරා ගන්න බැරි ජීවන වියදම් ප්‍රශ්නයකට - දැන් හෙට අනිද්දා විදුලි බිල වැඩි වෙන්න යනවා. විදුලි බිල වැඩිවීම වැඩි වෙන්නෙත් නැති බැරි මිනිහාට තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි මේ පනත් කෙටුම්පතට අදාළව කථා කරමු.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

දැන් මේ සියල්ල බලපාන්නේ සාමාන්‍ය ජනතාවට ගරු සභාපතිතුමනි. ඒ නිසා මේ ගාස්තු වැඩිවීම් සියල්ල මහජනතාවට බලපාන ප්‍රශ්නයක් නිසා මේ ගාස්තු වැඩිවීමත් දරා ගන්න බැහැ. වැටුප් වැඩිවීමකුත් සිද්ධ නොවන වෙලාවක. ඒ නිසා මේ වැඩි කිරීම්වලට ජනතා විමුක්ති පෙරමුණේ අපි විරුද්ධයි කියන කාරණය ඔබතුමාට මතක් කර දෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අද සමාජයේ ජීවත් වන මිනිස්සු විවිධ වැඩි කිරීම්වලට මුහුණ දෙමින් තිබෙනවා. ජනතාවගෙන් අය කරන බදුවලින් තමයි මේ ආණ්ඩුව ගෙනියන්නේ. ඒ නිසාම අපි මතක් කරන්න කැමැතියි දැන් මේ ගන්න තිබෙන හැම තැනකින්ම බදු ගහනවා වාගේම අවසානයේ බලලා මම හිතන්නේ විවාහ වෙන පුද්ගලයෙකුගෙනුත් ගන්න පුළුවන් උපරිම දේ හූරා කන තත්ත්වයකට තමයි අද පත් වෙලා තිබෙන්නේ. අපි දන්නවා, විවාහ දැන්වීමක් කරන්න මෙපමණ කල් තිබුණේ රුපියල් 200 ක මුදලක්. ඒ වාගේම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයකදී විවාහය ලියාපදිංචි කරන්න රුපියල් 200 යි. මේ මුදල තමයි සම්පූර්ණයෙන්ම රුපියල් 750 දක්වාත්, ඒ වාගේම රෙජිස්ට්‍රාර් කාර්යාලයක් තුළදී රුපියල් 1500 දක්වාත්, ඉන් පිටතදී තිබුණේ, රුපියල් 1050 යි. ඒ සියල්ල එකතු වුණාම රුපියල් 5250 ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. දැන් මේ විවාහය, උප්පැන්නය ඒ සඳහා සියලු සහතිකවලට මිල වැඩි කරන ගමන් විදුලි බිල වැඩි කළාම ආදාහනාගාරයක මිනී පුච්චනකොට ඒ ගාස්තුවත් අනිවාර්යයෙන්ම වැඩි වෙනවා. උපදින්නත් අද බදු ගෙවන්න වෙලා තිබෙන්නේ. අනික් පැත්තෙන් මැරෙන්නත් ඒ විධියේ වැඩියෙන් බදු ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඒ නිසා අපි පුද්ගලික මතක් කරන්නේ, මේ ආණ්ඩුව යටතේ හැම දෙයක්ම වැඩි වෙලා තිබෙනවා. එක දෙයක් අඩු වෙලා තිබෙනවා. ඒ තමයි මිනිස්සුන්ගේ ආයුෂ. අනික් හැම දේම වැඩි වෙලා. මේ ආණ්ඩුව යටතේ ආයුෂ විතරයි අඩු වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි පක්ෂයක් විධියට මේ වෙලාවේ මේ මිනිස්සුන්ට දරන්න තිබෙන අධික ජීවන බරට තවත් එකක් එකතු කරපු නිසා පක්ෂයක් විධියට මේකට සම්පූර්ණයෙන්ම විරුද්ධයි කියන එක අපි තමුන්නාන්සේලාට මතක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම කෙටුම්පත සම්බන්ධව ජනතා විමුක්ති පෙරමුණේ මතය ප්‍රකාශ කර එතුමා විරුද්ධයි කිව්වා. එක්සත් ජාතික පක්ෂයත් විරුද්ධත්වය ප්‍රකාශ කළා. ඒ නිසා මේ පිළිබඳව සභාවේ විරුද්ධවය ප්‍රකාශ වී තිබෙන නිසා අපට එකඟතාවය විමසීමට සිදු වෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එහෙම නොවෙයි. විරුද්ධ වුණත් තව මත තියෙන්න පුළුවන් නේ? ඒකට ඔබතුමා අවස්ථාව දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා විපක්ෂ නායක වශයෙන් මතය ප්‍රකාශ කළා. පක්ෂයක් වශයෙන් එතුමා මතය ඉදිරිපත් කළා. සාධාරණයි නේ?

ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පතට සභාවේ බෙදීමක් පවතිනවාද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 39 යි, විරුද්ධව 12 යි වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*Amended question put and the Provincial Council divided as per Rule 61(3) as 39 for, 12 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත වැඩි ඡන්ද 27 කින් සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටිනවා. සභාවේ තීරණය වූ පරිදි එම අදහස් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ලේකම්තුමා වෙත යොමු කරන ලෙස මම ලේකම්තුමාට දැනුම් දෙනවා.

# උඩරට විවාහ හා දික්කසාද [සංශෝධන] පනත් කෙටුම්පත : පළාත් සභාවේ අදහස් විමසීම

KANDYAN MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL: EXPRESSION OF PROVINCIAL COUNCIL

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත," ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 5 (අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් 2013 අප්‍රේල් මස 11 වන දිනට හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, 46 අ (2) අ වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ දන්වා ඇති හෙයින් හා එම දැනුම් දීම 2013.03.19 වන දින පැවැති බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා රැස්වීමේදී නිවේදනය කර, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදුව, එම කාරක සභාවේ වාර්තාවද ලැබී ඇති හෙයින් ඒ පිළිබඳවද සැලකිලිමත්ව, යථෝක්ත පනත් කෙටුම්පත පිළිබඳව තවදුරටත් මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළැඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය. "*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින්, 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 39 යි, විරුද්ධව 11 යි වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*Amended question put and the Provincial Council divided as per Rule 61(3) as 39 for, 11 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත වැඩි ඡන්ද 28 කින් සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටිනවා. සභාවේ තීරණය වූ පරිදි එම අදහස් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ලේකම්තුමා වෙත යොමු කරන ලෙස මම ලේකම්තුමාට දැනුම් දෙනවා.

# මුස්ලිම් විවාහ හා දික්කසාද [සංශෝධන] පනත් කෙටුම්පත : පළාත් සභාවේ අදහස් විමසීම

MUSLIM MARRIAGE AND DIVORCE (AMENDMENT) BILL: EXPRESSION OF PROVINCIAL COUNCIL

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත," ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 5 (අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් 2013 අප්‍රේල් මස 11 වන දිනට හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, 46 අ (2) අ වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ දන්වා ඇති හෙයින් හා එම දැනුම් දීම 2013.03.19 වන දින පැවැති බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා රැස්වීමේදී නිවේදනය කර, ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදුව, එම කාරක සභාවේ වාර්තාවද ලැබී ඇති හෙයින් ඒ පිළිබඳවද සැලකිලිමත්ව, යථෝක්ත පනත් කෙටුම්පත පිළිබඳව තවදුරටත් මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළැඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය." යන යෝජනාව ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය විමසනවා.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 43 යි, විපක්ෂව 12, වැළකුණු 00 යනුවෙන් බෙදුණේය.***
*Amended question put and the Provincial Council divided as per Rule 61(3) as 43 for, 12 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත වැඩි ඡන්ද 31 කින් සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටිනවා. සභාවේ තීරණය වූ පරිදි එම අදහස් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ලේකම්තුමා වෙත යොමු කරන ලෙස මම ලේකම්තුමාට දැනුම් දෙනවා.

# උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ [සංශෝධන] පනත් කෙටුම්පත : පළාත් සභාවේ අදහස් විමසීම

BIRTHS AND DEATHS REGISTRATION (AMENDMENT) BILL: EXPRESSION OF PROVINCIAL COUNCIL

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව - උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත," ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ 5 (අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත යොමු කර, පළාත් සභාවේ අදහස් 2013 අප්‍රේල් මස 22 වන දිනට හෝ ඊට පෙර පාර්ලිමේන්තුව වෙත වාර්තා කරන ලෙස, 46 අ (2) අ වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය යටතේ 2013 මාර්තු මස 21 දාතමින් දන්වා ඇති හෙයින් ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට 2013.03.27 වන දින රැස් වූ මෙම පළාත් සභාවේ සභා කටයුතු කාරක සභාවේදී ලද එකඟතාවය මත සහ කාර්යපටිපාටි රීති අංක 63 ආ (2) හා 63 ආ (3) යන රීතීන් හි සඳහන් විධිවිධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා යථෝක්ත පනත් කෙටුම්පත පිළිබඳව මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළැඹෙන තීරණයන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ලබා දීමට ක්‍රියා කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය විමසනවා.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින්, 61(3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 43 යි, විපක්ෂව 13, වැළකුණු 00 යනුවෙන් බෙදුණේය.***
*Amended question put and the Provincial Council divided as per Rule 61(3) as 43 for, 13 against and 00 decliners.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත වැඩි ඡන්ද 30 කින් සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටිනවා. සභාවේ තීරණය වූ පරිදි එම අදහස් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ලේකම්තුමා වෙත යොමු කරන ලෙස මම ලේකම්තුමාට දැනුම් දෙනවා.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

PRIVATE MEMBERS MOTION:

# පස්වරු 6.00 සිට රාත්‍රී 11.00 තෙක් රාත්‍රී බස් සේවාවක් ලබා දෙන මෙන් රජයෙන් ඉල්ලා සිටීම

REQUESTING FROM GOVERNMENT TO COMMENCE A NIGHT - BUS SERVICE FROM 6.00 A.M. TO 11.00 P.M.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"ලංකාවේ බස් සේවය රජය සතුව තිබියදී එය ගෞරවනීය සේවයක්ව තිබූ බව කවුරුත් පිළිගන්නා කරුණකි. ස්ථිර වැටුපක් සහිතව අත්‍යවශ්‍ය වරප්‍රසාද එම සේවය කළ සියලු දෙනාටම ලැබුණු අතර ජනතාවද තමාගේ ගෞරවය රැකගෙන ගමන් බිමන් යාමට බිය නැතිව පාරට පැමිණි බව අපි දනිමු.*

*නමුත් පෞද්ගලික බස් සේවය පටන් ගත් පසු මගීන්ගේ ගෞරවය කෙලෙසාගෙන එහි ගමන් කළ යුතු අතර කොතරම් කාල සටහන් සකස් කර දුන්නත් ඒවා පිළිපදින අය ඉතාමත් අඩුය. මෑතකදී රජයෙන් බස් ගෙන්වා බස් සේවය ශක්තිමත් කරන්නට යන බව පුවත්පත්වල සඳහන් වී තිබේ. කොතරම් බස් ලංකාවට ගෙනාවත් රාත්‍රී බස් සේවය ක්‍රියාත්මක නොවෙනවා නම් ජනතාවට පහසුකම් සැලසේ යැයි සිතිය නොහැක. එම නිසා රජයේ බස් සේවයට ගෙන්වන එම බස් රථ සාධාරණ සංඛ්‍යාවක් යොදවා පස්වරු 6.00 සිට අවම වශයෙන් රාත්‍රී 11.00 වන තෙක් වත් ජනතාවට මහ මග රස්තියාදු නොවී ගමනා ගමන අවශ්‍යතාවය ඉටු කර ගැනීමට හැකි බස් සේවයක් ලබා දෙන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[ පූ.භා. 11.54 ]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, ඉස්සර අපට ලංගමයේ බොහොම හොඳ බස් සේවයක් තිබුණා. ඒ කාලයේ ඒ අයට ස්ථිර වැටුපක් තිබුණා. වරප්‍රසාද තිබුණා. ඒ බස් සේවය කළ යුතු ආකාරය පිළිබඳව ඒ අයට සටහනක් තිබුණා. ඒ වාගේම වැඩිපුර වැඩ කරන අයට අතිකාල දීමනා තිබුණා. ඒ නිසා සේවකයෝ සතුටින් වැඩ කළා. නියමිත කාල සටහන් ක්‍රියාත්මක කරන්න එතරම් බාධාවක් තිබුණේ නැහැ. ඒ කාල සටහන් අනුව බස් ධාවනය වුණා. රාත්‍රී කාලයේදී ගමන් බිමන් යාමටත් කිසිම භයක් තිබුණේ නැහැ. අපි දන්නවා. අපේ සහෝදරයෝ, අපේ වැඩිහිටියෝ ඒ කාලයේ කියනවා. නවයේ ෂෝ එක බලලා භය නැතිව එන්න පුළුවන් එකොළහට තිබෙන බස් එකේ කියලා. ඒ වාගේම රාත්‍රී වැඩ මුර කරන සේවකයෝ දන්නවා. ඒගොල්ලන්ට ඒ වැඩ මුරය ඉවර වුණාම අභවල් වෙලාවට ගමනාන්තය දක්වා ගමන් කරන්න බස් එකක් එන බව. ඒක බොහොම ජනප්‍රිය තත්ත්වයෙන් තිබුණා. නමුත් අද වන කොට මේ පුද්ගලික බස් සේවය ක්‍රියාත්මක වෙලා, ලංගම බස් රථත් එක්ක හවුලේ දුවන්න ගියාට පස්සේ මේ දෙකෙන්ම ඒ සේවය ඉටු වෙන්නේ නැහැයි කියන එක මම ප්‍රකාශ කරන්න කැමැතියි. මම පළාත් සභා මන්ත්‍රීවරියක් හැටියටත් බස් එකේ ගිය කෙනෙක්. ඒ අවස්ථාවේදීත් මම මේවා අත්දැකීමෙන් දැක්කා. මොකද, සවස 6.00 න් පස්සේ හුඟාක් බස් රථ එක්කෝ භාගයක් දුරට ඇවිල්ලා නවතිනවා. කොටසක් දුර ඇවිල්ලා කියනවා මෙතැනින් එහා අපි යන්නේ නැහැයි කියලා. ඒ මිනිස්සු ආයිත් බස් රථ සොයන්න ඕනෑ. හුඟාක් වෙලාවට නියමිත කාල සටහනකට බස් දුවන්නේ නැහැ.

මට උදාහරණ හුඟාක් සපයන්න පුළුවන්. අපේ ආසනයේ 164 බස් රථය දවල් කාලයට තිබෙනවා. නමුත් රාත්‍රී කාලයේදී 164 නැහැ. 134 බස් එක දැන් ඇත්තේම නැහැ. 131 කියලා බස් එකක් තිබුණා. ඒක ඇත්තේම නැහැ. අනික් එක මේ බස් රථ ධාවනය කරන කොට ඕනෑවට වඩා දුර ප්‍රමාණවල් ධාවනය වන කොටත් විශාල කාලයක් යන නිසා සමහර වෙලාවට බස් මගීන්ට බසය තුළ විශාල කාලයක් ඉන්න වන කොට එපා වන තත්ත්වයක් තිබෙනවා. කොහොම නමුත් මම අද විශේෂයෙන් කියන්නේ, ලංගම සහ පෞද්ගලික බස් රථ සේවා සියල්ලන්ගෙන්ම යම්කිසි බස් ප්‍රමාණයක් රාත්‍රී සේවය සඳහා වෙන් කරන්නය කියලා. මිනිස්සුන්ට හදිසි අමාරුකම් ඇති වෙනවා. රාත්‍රී කාලයේ ගමන් කරන්න ඕනෑ වෙනවා. විශේෂයෙන් අද සමහර පැතිවල ඒක යථා තත්ත්වයට පත් කරන්න බැහැ. මොකද, ඒකෙන් වාසි ගන්න ත්‍රීරෝද රථ අය බලාගෙන ඉන්නවා. ඒගොල්ලොත් කරන්නේ කර්මාන්තයක්. මම ඒගොල්ලන්ට දොස් කියනවා නොවෙයි. නමුත් ත්‍රීරෝද රථයක් අරගෙන සල්ලි දෙන්න බැරි අයට පයින් තමයි ගමන් කරන්න සිද්ධ වෙන්නේ. ඒ නිසා මේක සාධාරණව ක්‍රියාත්මක වුණොත්, මම විශ්වාස කරන හැටියට රටේ සාමාන්‍ය දුප්පත් මිනිස්සුන්ට විශාල සේවාවක් කර ගන්න පුළුවන්. අනික් එක සමහර වෙලාවට අවශ්‍ය ගමනාන්තය දක්වා යන්න කියන වෙලාවට වඩා වැඩි වෙලාවක් ගත වෙනවා. අපි කියන්නේ නැහැ, බස් රේස් යන්න කියලා. බස් රේස් එකේ යාමෙන් සිදු වන අනතුරු පිළිබඳව අපට හොඳ අවබෝධයක් තිබෙනවා. නමුත් මම හිතන්නේ, පටන් ගත්ත තැන ඉඳලා ගමනාන්තය දක්වා යන්න සාධාරණ කාලයක් දුන්නාම, ඒ අය ඒ කාලය තුළ ඒ ගමනාන්තයට ළඟා වෙන්න ඕනෑ. මෙතැන සිද්ධ වෙන්නේ, වැඩි ආදායම ලබා ගන්න, බස් බොහෝ වෙලාවට බොහොම හෙමින් ධාවනය වෙන්නේ. අනික් එක නියමිත බස් නැවතුම්පළවල් දැන් නැහැ. බොහොම ටිකයි තිබෙන්නේ. බස් එක හිතු හිතු තැන්වල නවත්වනවා. ඒ වාගේම සමහර වෙලාවට අතුරු පාරවල් මැද බස් රථය නවත්වන්නේ. අතුරු පාරවල් මැද බස් රථය නැවැත්තුවාම අතුරු පාරෙන් එන වාහන බලාගෙන ඉන්න ඕනෑ බස් රථය ඒ තැනින් ඉවත් වන තෙක්. මෙන්න මේ වාගේ තවමත් කළමනාකරණය කර ගන්න බැරි වුණු දේවල් ගොඩක් මේ පුද්ගලික බස් සේවයේ තිබෙනවා.

ඒ වාගේම මම විශ්වාස කරනවා. ඒගොල්ලන්ව සාධාරණ මාසික වැටුපක් එක්ක මේ සේවයේ යොදවනවා නම්, සමහර වෙලාවට මේ අයුතු ක්‍රියාමාර්ගවලින් වැළකෙන්න ඉඩ තිබෙනවා. අනවශ්‍ය විධියට මුදල් පසුපස හඹා යෑම නිසා ඒ බස් රථ සේවාවෙන් සාධාරණව කෙරිය යුතු බොහෝ දේවල් කෙරෙන්නේ නැති බව අපට පෙනෙන්න තිබෙනවා. මම විශේෂයෙන්ම රජයෙන් ඉල්ලා සිටින්නේ, ලංගම බස් රථ නැවත පරණ ක්‍රමයේ සේවයට පත් කරන්න. රාත්‍රී කාලයේ බස් රථ ධාවනය වෙන්න.

අවශ්‍ය තැන්වලට ඒක යොමු කරන්න. නියමිත වේලාවක් ලබා දෙන්න. මිනිස්සුන්ට විශ්වාසයක් ඇතිව පාරට බැහැලා, බස් රථය තියෙයි කියන විශ්වාසයෙන් යුතුව ඒකට ගොඩ වෙන්න අවස්ථාව සලසා දෙන්නය කියන එක මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම රාත්‍රී බස් සේවාව පුද්ගලික අයට භාර දෙන්නේ නැතිව ඒක ලංගමයෙන් කරනවා නම්, මම හිතන්නේ ඒක සාර්ථකව කර ගෙන යාමට ලේසියි. මේ යෝජනාව මම හුඟාක් කාලයකට ඉස්සෙල්ලා ඉදිරිපත් කරපු එකක්. ඒ දවස්වල බස් රථ එනවා කියලා, ලංගමයෙන් බස් රථ ගෙන්වනවා කියලා තිබුණු ආරංචියට තමයි මම ඉක්මණට මේ යෝජනාව ඉදිරිපත් කළේ. නමුත් අපේ යෝජනා පෙළගැස්වෙන හැටියට අවුරුද්දක් විතර යන වෙලාවල් තිබෙනවා. කොහොම නමුත් ඉදිරියේදී හරි ලංකා ගමනා ගමන මණ්ඩලයට බස් රථ ගෙන්වනවා නම්, ඒකෙන් සාධාරණ ප්‍රමාණයක් රාත්‍රී කාලයේ බස් සේවය සඳහා යොදවන්නය කියන එක මම ඉතාම ගෞරවයෙන් සභාපතිතුමා
[ ගරු අශෝකා ලංකාතිලක ]

මාර්ගයෙන් ඉල්ලා සිටිනවා, මධ්‍යම ආණ්ඩුවේ ඇමතිවරයාට දන්වන්නය කියලා.

ඒ වාගේම අපට ගොඩාක් චෝදනා එන එකක් තමයි. ගරු සභාපතිතුමා මගින් මම අපේ පළාත් සභා ප්‍රවාහන ඇමතිවරයාට මතක් කරනවා. දැන් පෞද්ගලික බස් රථ අතුරු පාරවල්වල යොදවලා තිබෙනවා. ඒක සමහර වෙලාවට පාසල පටන් ගන්න වෙලාවට පාසලට එන්න පුළුවන් විධියට නොවෙයි පටන් ගන්නේ. මොකද, පාසලට එන ගුරුවරුන්ට, ගුරුවරියන්ට, දරුවන්ට යම්කිසි තැනකින් පටන් අරගෙන එන්න පුළුවන් ක්‍රමයට නියමිත වෙලාවට මේ බස් රථ යෙදෙනවා නම්-

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දහම් පාසල්.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ඔව්. දහම් පාසල්. ඒවා පටන් ගන්න වෙලාව එකම වෙලාව. ඒ වාගේ වෙලාවට දරුවන්ට ඒ ස්ථානයට ළඟා වෙන්න පුළුවන් විධියට සුළු බස් ප්‍රමාණයක් හරි සකස් කරන්න ඕනෑ. එතකොට ඒ තැන්වලට නියමිත වෙලාවට එන්න දරුවන්ට, ගුරුවරුන්ට පහසුකම් ලැබෙනවා. ඒ වාගේම පාසල් ඇරෙන වෙලාවට පාසල් ඉලක්ක කර ගනිමින් බස් රථ කිහිපයක් යොදවනවා නම්, මම හිතන්නේ අර වාහන ගොඩාක් කොළඹට එන තත්ත්වයෙන් මග හැරිලා බස් රථවලින් දරුවන්ට ගෙදර යන්නට පුළුවන් ක්‍රමයක් සකස් කර ගන්න පුළුවන්. මොකද, පෞද්ගලික වාහන ගොඩාක් එකම වෙලාවට නගරයට ඇදී එන්නේ, පොදු බස් සේවාවල් ශක්තිමත් නැති නිසා. වෙලාවට වැඩට යන්න කැමැති අය, නැත්නම් තමන්ගේ රාජකාරිවලට එන අය පෞද්ගලික වාහන පාවිච්චි කරනවා. නමුත් ඒකෙන් විශාල තදබදයක් ඇති වෙනවා. අපි මේ ප්‍රශ්නවලට පිළියම් එක්ක හොඳ බස් සේවයක් ආරම්භ කළොත් මම හිතන්නේ අපේ කාලය විනාශ වන, ඉන්ධන නාස්ති කරන අර තදබදය, මාර්ග තදබදය අවම කර ගන්න පුළුවන් වෙනවා. ඒ නිසා මේ සියලු කරුණු පිළිබඳව මධ්‍යම රජයත්, පළාත් සභාවත් ලොකු අවධානයක් යොමු කරන්නට ඕනෑ. එතකොට මම හිතන්නේ අපේ අපතේ යන කාලය, ඉන්ධන මේ රටේ සංවර්ධනයට යොදන්න පුලුවන්. ජනතාවට ගෙවන්න තිබෙන කාලය හුඟාක් අවම කර ගන්න පුළුවන්. ඒ වාගේම ක්‍රමානුකූලව අපි මේ වැඩ නොකිරීමෙන් පැත්තක ඉන්න සමහර බස් මුදලාලිලා අයුතු විධියට මුදල් හම්බ කරන්න උත්සාහ ගන්නවා. ඒ වාගේම බස්වලට ගාස්තු වැඩි කරන්න කියලා ඉල්ලා සිටීමේ සාධාරණ ප්‍රවණතාවයකුත් තිබෙනවා. මොකද, අර මග තිබෙන අනවශ්‍ය තදබදයට යන ඉන්ධන වියදම් පියවා ගන්න ඒ අයට සිද්ධ වන නිසා සමහර වෙලාවට නොයෙකුත් ඉල්ලීම් ඉල්ලන්න පුළුවන්. ඒවායේදී සාධාරණය කරන්න ගියොත් මගී ජනතාවට විශාල අපහසුකම් රාශියකට මුහුණ දෙන්න වෙනවා. ඒ නිසා මම විශේෂයෙන් දෙපැත්තෙන්ම ඉල්ලනවා. පළාත් සභාවෙනුත්, මධ්‍යම රජයෙනුත් ඉල්ලා සිටින්නේ මේවා ගැන විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ දාලා, නැත්නම් ලොකු ප්‍රවීනයෝ දාලා විශාල මුදලක් ගෙවලා පරීක්ෂණ කරනවාට වඩා, මහජනයාගෙන් කරුණු ගත්තාම ඒගොල්ලන්ට තිබෙන අපහසුතාවයන්, ඒගොල්ලන්ට තිබෙන අවශ්‍යතාවයන් පැහැදිලි වෙයි. ඒ අනුව මේ බස් සේවය සාර්ථක කරන්න පුළුවන්කම ලැබෙනවා.

විශේෂයෙන්ම මම අවධානය යොමු කරන්න කැමැතියි. සමහර බස් රථ ධාවනය වූ මාර්ගවල දැන් බස් රථ එකක්වත් නැහැ. මම ඉස්සෙල්ලා සඳහන් කළා වාගේ. දැන් කොලොන්නාව ආසනය ගැන තමයි මම වැඩියෙන්ම කියන්න දන්නේ. 134 හුඟාක් ප්‍රයෝජනයක් තිබුණු බස් රථයක්. මට මතකයි. ඒක ගල්කිස්ස දක්වා දුවන කොට ඒ ප්‍රමාණය දුර වැඩියි. ඒකෙන් ආදායම් ප්‍රශ්න ඇති වන නිසා අපි ඊට වඩා කෙටි මාර්ගයකින් ගමනාන්තය කරන්නත් අපි කථා කළා. මොකද, ගාලු පාරේ අවශ්‍ය බස් ඕනෑ හැටිය තිබෙනවා. ඒ නිසා පිටකොටුව දක්වා දිව්වොත් ඒක තවදුරටත් රඳවා ගන්න පුළුවන් කියන එක අපි කිව්වා. ඒ වාගේම 131 බස් එක, ඒ මාර්ගයට වැල්ලම්පිටියේ ඉඳලා යන්න තිබුණු හොඳම බස් රථයයි. 131. කොලොන්නාවෙන් පටන් අරගෙන ඒක නුගේගොඩ පහු කර ගෙන විජේරාම දක්වා දිව්වා. මහා දිග පාරක්.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මහරගමට.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

මහරගම දක්වා දිව්වා. ඒ ගමනාන්තය කෙටි කරලා, ඒ බස් සේවාව නැවත ආරම්භ කරනවා නම්, ඒ මාර්ගයෙන් යන බස් රථයක් කොළොන්නාවට නැති නිසා නැවත ඒක ජනප්‍රිය කර ගන්න පුළුවන්. ඉතින් මෙන්න මේ වාගේ කරුණු තමුන්නාන්සේලාගේ අධ්‍යයනයට යොමු වෙන්න ඕනෑ.

විශේෂයෙන්ම රාත්‍රී කාලයේ බස් නැතිකම නිසා රාත්‍රී සේවා මුරවල යෙදෙන අයට ලොකු අපහසුකම් විඳින්න සිද්ධ වෙනවා. කොටින්ම කිව්වොත් රාත්‍රී කාලයේ වැඩ ඉවර වෙලා එන කාන්තාවන්ට මේක මහා පරිමාණයෙන් බලපානවා. එක පැත්තකින් කාන්තාවකට ඒ වාගේ බස් ගාලක හිටගෙන ඉඳීමෙන් අති වන ගෞරවය පිළිබඳ ප්‍රශ්න ගොඩාක් තිබෙනවා. මොකද, ඒ වෙලාවට බස් රථය එන තෙක් අහිංසක කාන්තාවක් ඉඳගෙන හිටියොත් එයා දිහා වපර ඇහින් තමයි යන එන ජනතාව බලන්න ගන්නේ. ඒ වාගේම එතැන බස් රථය නොතිබුණොත් ත්‍රී රෝද රථයකට තනියම නගින්න බියක් දැනෙනවා. ඒ වාගේම ඒ අය ඒ තුළින් විශාල මානසික ප්‍රශ්නවලට මුහුණ දෙනවා. ඒ වාගේම අවසානයේදී රැකියාවට යන්නේ නැහැයි කියන තීරණයට එන්න පවා ඒ අයට සිද්ධ වෙනවා. අපි දැන් කාලාන්තරයක් තිස්සේ රාත්‍රී බස් සේවය ගැන වරින් වර කථා කළා. නමුත් තවම සාර්ථක ප්‍රයත්නයක මේක යෙදිලා නැහැ. ඒ නිසා මම මධ්‍යම රජයේ කුමාර වෙල්ගම ගරු අමාත්‍යතුමාගෙනුත් ඉල්ලා සිටිනවා. සාධාරණව යම් බස් ප්‍රමාණයක් යොදවලා, රාත්‍රී බස් සේවයත් සාර්ථක කර ගන්න එතුමාගේ ශක්තිය ලබා දෙන්නය කියලා.

ඒ වාගේම අපේ ගරු සභාපතිතුමා මාර්ගයෙන් පළාත් සභාවේ උපාලි කොඩිකාර ගරු ඇමතිතුමාටත් මම දැනුම් දෙනවා. රාත්‍රී බස් සේවය ක්‍රමානුකූල කරන්න ඔබතුමාගේ සහාය අපට ලබා දෙන්නය කියලා. මම දීර්ඝව මේ පිළිබඳව කථා කරන්නේ නැහැ. විශේෂයෙන් මේ කරුණු තමුන්නාන්සේලා අවධානයට අරගෙන, මේ සේවයන් සාර්ථක කර ගන්න, ඒ වාගේම තිබෙන අඩුලුහුඬුකම් හරිගස්සවා ගන්න අවස්ථාව සලසනු ඇතැයි කියලා බලාපොරොත්තු වෙමින් මධ්‍යම රජයටත්, පළාත් සභාවටත් මේ කටයුත්ත කරන්නට දිරි දෙමින් මම මේ අවස්ථාවේදී නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.06 ]

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, ඇත්තටම මෙම යෝජනාව කාලෝචිත යෝජනාවක්. අපි සන්තෝෂ වෙනවා. ආණ්ඩු පක්ෂයේ ජ්‍යෙෂ්ට ගරු මන්ත්‍රීතුමියක් විසින්ම මෙම යෝජනාව ගෙන ඒම සම්බන්ධව ඇත්තටම සතුටු වෙනවා. මෙතුමිය දීර්ඝ වශයෙන් අද උදේ වරුවේත් කුණු කන්දක් සම්බන්ධව කථා කළා. මීට පෙර මේ සම්බන්ධව හැන්සාඩ් වාර්තාවල සඳහන් වෙනවා. මමත් මේ ස්ථානයේ හිටියා. කිහිප වතාවක් කථා කළා. නිර්භීතව කථා කළා. අදත් ඒ වාගේම නිර්භීතව මේ වාගේ යෝජනාවක් දැමීම සම්බන්ධව සතුටු වෙන්නේ එතුමිය ප්‍රාදේශීය සභාවෙන් මේ තත්ත්වයට ආපු මන්ත්‍රීවරියක් නිසයි. ඇත්තටම ටිකක් දුකක් දැනෙන විධියට කථා කළත් ඇත්ත දේ ඒකයි. කෙසේ වෙතත් එතුමිය ඒ ආකාරයෙන් කථා කරලා, මේ වාගේ යෝජනාවක් ගෙනැල්ලා මේ වාගේ සාර්ථක විවාදයකට ගෙන ඒම සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා. එතුමියට නම් යම් යම් ප්‍රශ්න ඇති වෙනවා. අපි දකිනවා කොළොන්නාවේ අද නිල් රැල්ල පෝස්ටර් ව්‍යාපාරයේ මෙතුමියගේ ෆොටෝ එක නැහැ. අර සෝලංග සභාපතිතුමාගේ ෆොටෝ එක විතරයි තිබෙන්නේ. මෙතුමිය තමයි ජ්‍යෙෂ්ට. කොළොන්නාවේ. කෙසේ වෙතත් මෙතුමිය නිර්භීතව මෙම පක්ෂය තුළ මෙම යෝජනාව ගෙනැල්ලා, කිවයුතු තැන කියලා, කාන්තාවක් වශයෙන් හඬ නගලා කථා කිරීම සම්බන්ධව අපි සතුටු වෙනවා.

ඇත්තටම අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් වශයෙන් මේ සම්බන්ධව ගියවර උපදේශක කාරක සභා රැස්වීමේදීත් ගරු අමාත්‍යතුමාත්, අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් දීර්ඝ වශයෙන් කථා කළා. මේ යෝජනාවමයි. රැස්වීමේත් භාගයක් ගියේ මේ යෝජනාව සම්බන්ධව කථා කරන්නයි. මෙතුමිය කිව්වා යෝජනාව දාලා ගොඩක් කල් ගත වෙලා තිබෙනවා. මේ යෝජනාව එන්න ගොඩක් පරක්කු වෙලා තිබෙනවා. ඒත් එදා උපදේශක කාරක සභා රැස්වීමේදීත් ගෙනාවේ මේ යෝජනාවමයි. ඇත්තටම මේක විය යුතු දෙයක්. කොපමණ කථා කළත්. වෙන්නේ නැහැ. අපි උපදේශක කාරක සභා රැස්වීමේදීත් කථා කරනවා. ගරු අමාත්‍යතුමා නිලධාරීන්ට නිර්භීතව උපදෙස් දෙනවා. ඒත් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් මම දකින දේ. අර ඒකාබද්ධ කාල සටහනක් තිබෙනවා. අපේ ලංගම බස්වලටත්. පෞද්ගලික බස් වලටත්. ඒක තුළ තමයි මේක හිර වෙලා තිබෙන්නේ. ඇමතිතුමනි, නිර්භීතව කියන්න වෙනවා. ඒකාබද්ධ කාල සටහන තුළ පෞද්ගලික බස් සංගම්වලට අපි යට වෙලා. මේක තමයි ඇත්ත දේ. අද මෙතුමාට විරුද්ධව - මම දන්නේ නැහැ. අද දවසේත් මාරාන්තික උපවාස තිබෙනවා. ඒ වාගේම අවුරුදු සමයේ බස් ගාස්තු වැඩි කිරීම සම්බන්ධව යම් යම් මත තිබෙනවා. ඒත් මෙතුමා කෙළින් ඉන්නවා. අපි සතුටු වෙනවා. ඇයි අපි යට වෙන්නේ? අපේ බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන කටයුතු භාර අමාත්‍යවරයෙක් ඉන්නවා. අමාත්‍යාංශයක් තිබෙනවා. අපි පෞද්ගලික අංශයට යට වෙනවා. ඇයි හේතුව? ලංගම බස් ප්‍රමාණය අපට අඩු හින්දා. එහෙම නම් ඒ ප්‍රමාණය වැඩි කරන්නේ නැත්තේ ඇයි? එයට හේතු ගණනාවක් තිබෙනවා. මෙතැන දේශපාලනය තමයි හැම තැනම තිබෙන්නේ. දේශපාලනය හිර වෙලා තිබෙනවා. එතකොට ඒකාබද්ධ කාල සටහනටත් දේශපාලනය හිර වෙනවා. ඒකාබද්ධ කාල සටහන අනුව - උදාහරණයක් වශයෙන් ගන්නවා නම් මම ජීවත් වන 230 කැළණිය - කිරිබත්ගොඩ, සපුගස්කන්ද හරහා යන බස් රථය. මෙතුමිය කිව්ව ආකාරයට රාත්‍රී 6.30 න් 8.00 න් පස්සේ බස් නැහැ. ඒ වාගේම 135 කැළණිය - කොහුවල බස් රථ. රාත්‍රී කාලයේ බස් නැහැ. ඉතින් මේ සම්බන්ධව

කොතැනද හිර වෙලා තිබෙන්නේ කියලා මම බලන කොට මට දැන ගන්න ලැබුණේ, ඒ තැන්වල ලංගම බස් ප්‍රමාණය එකයි දෙකයි තිබෙන්නේ. පෞද්ගලික බස් 13 ක, 14 ක ප්‍රමාණයක් ඒ පාරවල්වල, ඒ මාර්ගවල තිබෙනවා. ඒකට යට වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ යෝජනාව තුළින්වත් ඇස් ඇරෙන්න. මේ යෝජනාව තුළින්වත් අපි යම්කිසි දෙයක් කරමුයි කියන එක තමයි අවංක ඉල්ලීමක් කරන්නේ.

අපි දකිනවා. ගරු මන්ත්‍රීතුමියත් කිව්වා. රාත්‍රී චිත්‍රපටි, 9.30 ෂෝ එක තිබුණා නම් මේ තත්ත්වය ඇති වෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි අද ඔබතුමන්ලාගේ රජයෙන්ම කියනවා නම්. ආශ්චර්යමත් දේශයකට යනවා කියලා. අපි උදාහරණයක් හැටියට දඹුල්ලේ රාත්‍රී කාලයේත් වෙළඳාම් කරනවා නම්, ඒ වාගේ ආර්ථිකයක් හදන්න ඕනෑ නම් මේ ක්‍රමයත් වෙනස් වෙන්න ඕනෑ. එහෙම නම් පාරවල් හදලා, මංමාවත් හදලා, කාපට් කරලා, කොන්ක්‍රීට් දැම්මාට මේ පරිපාලනයේ තිබෙන දෝෂය අඩු කර ගන්නත් ඕනෑය කියන එක මෙතැන්දී අපේ මේ යෝජනාව තුළ ඇති වෙලා තිබෙනවා. එම නිසා අපි ඉල්ලීමක් කරනවා. පක්ෂ

[ ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

විපක්ෂ භේදයකින් තොරව මෙතුමියගේ යෝජනාවට අපි එකඟ නිසයි විපක්ෂයෙන් ස්ථිර කළේ. මේ තුළ අපි දීර්ඝ වශයෙන් ඉල්ලනවා වාගේම, උපදේශක කාරක සභාවේදී කථා කරනවා වාගේම, පළාත් සභාවේ න්‍යාය පත්‍රයට ගෙනාපු මේ යෝජනාව තුළිනුත් ඉල්ලීමක් කරන්නේ, මෙතුමියගේ මේ කාලෝචිත යෝජනාව ඉෂ්ට කරන්නය කියලයි. එසේ ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[ අ.භා. 12.11]

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා. අපේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීතුමිය වන අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව මම හිතන්නේ, ඉතාමත් වැදගත්ම යෝජනාවක් වශයෙන්, පළාත් සභාවේ පොදු ප්‍රශ්නවලට ආවේණික යෝජනාවක් වශයෙන් මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම එතුමියට ස්තූතිවන්ත වෙනවා. අපි දකිනවා. බස්නාහිර පළාත් සභාව දිහා බැලුවොත් බස්නාහිර පළාත් සභාව ඉතාමත්ම ජන සංකීර්ණයක්, ජනතාවගේ බහුලත්වයක් තිබෙන, ජන ඝනත්වයක් තිබෙන අධික නගරවලින් යුක්ත පළාත් සභාවක්. කළුතර දිස්ත්‍රික්කය ගත්තත්, ගම්පහ දිස්ත්‍රික්කය ගත්තත්, කොළඹ දිස්ත්‍රික්කය ගත්තත් බහුතර ජනතාවක් 80% ක 85% ක මගී ජනතාව පාවිච්චි කරන්නේ පොදු බස් සේවාව කියන එක අපි තමුන්නාන්සේලා දන්නවා. මේ සමස්ථ ජනතාවගෙන් 85% ක් වන පොදු ජනතාව පාවිච්චි කරන්නේ මගී බස් රථ නම්, අද මේ මගී බස් රථ සංඛ්‍යාව දිහා බලන කොට අපට පැහැදිලිව පෙනෙනවා. මේ පෞද්ගලික හා රජයේ බස් සේවාව, ඒකාබද්ධ බස් සේවාවක් වශයෙන් ක්‍රියාත්මක වුණත්, එහි කාල සටහන පිළිබඳව සොයා බැලීමේදී මේ වන තුරු ඒක Update වීමක් වෙලා නැහැයි කියලා. එය යථා තත්ත්වයට අලුත් කිරීමක් සිද්ධ වෙන්නේ නැහැයි කියන එක තමයි ජනතාවගේ හැඟීම. මට උදාහරණයක් හැටියට පෙන්වන්න පුළුවන් ගරු සභාපතිතුමනි. අපි දුම්රියක ගමනක් යන කොට දුම්රිය ස්ථානයක හෝ පොදු බස් ස්ථානයක හිටියා නම් දුම්රිය සේවාවත්, බස් සේවාවත් පිළිබඳව මහජනතාවට අන්‍යෝන්‍ය අවබෝධයක්, අන්‍යෝන්‍ය වැටහීමක්, කාල සටහන් පිළිබඳව අන්‍යෝන්‍ය අවබෝධයක් මගී ජනතාවට තිබෙන්න ඕනෑ. අපි උදාහරණයක් වශයෙන් ගත්තොත් දුම්රිය සේවාව තිබෙන ඒ ස්ථානයත්, ඒ වාගේම බස් නැවතුම්පොළත්, දුම්රිය නැවතුම්පොළත් අතර තිබෙන්නේ මීටර් 500 ක් නම්, මීටර් 250 ක් නම් යම් අවස්ථාවකදී බස් රථයකට 100 ක ජනතාවක මගීන් ඉන්න කොට ඒ ජනතාවගෙන් 75% කට අවබෝධයක් නැහැ ඒ අවස්ථාවේ දුම්රියෙන් තමන්ට අවශ්‍ය ඒ සේවාව ලබා ගන්න පුළුවන් ආකාරයට ඒ වෙලාවේ දුම්රියක් යනවා කියලා. ඒ අවබෝධය නැහැ. ඒ නිසා අපි මුලින්ම දුම්රිය සේවාව සහ බස් සේවාව අතර තිබෙන්නා වූ අන්තර් සම්බන්ධීකරණය, අන්තර් පණිවුඩ හුවමාරු යන්ත්‍රය පිළිබඳව ජනතාව තුළ දැනුවත් කරන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. අද අපට සන්නිවේදනය පිළිබඳව කිසි ගැටළුවක් නැහැ. එසේ සන්නිවේදනය පිළිබඳව ගැටළුවක් නැත්නම්, අපට පුළුවන් වෙන්න ඕනෑ දුම්රිය අධිකාරියත්, ඒ වාගේම ජාතික ගමනා ගමන මණ්ඩලයත්, පෞද්ගලික බස් සේවාවත් මේ ආයතන තුළ ත්‍රිමානයක ඉඳගෙන, අන්තර් සම්බන්ධතාවයක් පවත්වාගෙන කාල සටහන් පිළිබඳ අවබෝධයක් ඇතිව මේ සම්බන්ධීකරණ වැඩ සටහන ක්‍රියාත්මක කරන්න. එසේ කළා නම් ජනතාවගේ, මගීන්ගේ යහපත වෙනුවෙන් ඒ තමන්ට අවශ්‍ය කරන ඒ ගමන යන්නට ඔවුන්ට එක්කෝ දුම්රිය තෝරා ගන්න පුළුවන් වෙනවා. එක්කෝ පෞද්ගලික බස් රථයක් තෝරා ගන්න පුළුවන් වෙනවා. එහෙම නැත්නම් තමන්ට රාජ්‍ය බස් සේවයක් තෝරා ගන්න පුළුවන් වෙනවා. මෙන්න මේක සිදු විය යුතු කරුණක්. ඒ නිසා පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් මම යෝජනා කරනවා, අපේ ගමනාගමන අමාත්‍යතුමාට, කුමාර වෙල්ගම අමාත්‍යතුමාට. අපේ බස්නාහිර පළාත් සභාවේ යෝජනාවක් වශයෙන් පළමුව විය යුත්තේ, අපේ දුම්රිය සේවාව සහ බස් සේවාව අතර තිබෙන්නා වූ කාල සටහන් පිළිබඳ අවබෝධයක් මගී ජනතාවට ලබා දීමයි. එය ඉතාමත්ම අත්‍යාවශ්‍ය කරුණක් කියන එක මම යෝජනා කරනවා. එය අපට ලබා දෙන්නයි කියන එක ඉල්ලා සිටිනවා. මට පුංචි කාලේ මතකයි. අපි ටියුෂන් යන කොට බස් හෝල්ට් එකේ ඉන්න කොට අපේ යාළුවෝ කියනවා. මචං මේ වෙලාවේ Train එක තිබෙනවා. Train එකේ යන්න පුළුවන් කියලා කියනවා. එතකොට අපි අපට තිබෙන ඒ අවබෝධය තුළ තමයි දුම්රිය සේවාව ලබා ගන්නේ. එතකොට ඒ වෙලාවට දුම්රියක් තිබෙනවා නම්, ඒ දුම්රිය සේවාව ජනතාව පරිභෝජනය කරන්නේ 50% ක් නම් මේ අන්තර් සම්බන්ධතාවය හරියට

ක්‍රියාත්මක කළා නම් මම හිතන්නේ මගීන්ට ඉතාමත්ම පහසු විධියට ඒ කටයුත්ත කරන්න පුළුවන්.

දෙවැනි කරුණ තමයි ගරු සභාපතිතුමනි, අපි දකිනවා, සමාජයේ 75% ක් 80% ක් මේ මුහුදුකරයේ ජීවත් වන ජනතාව පාවිච්චි කරන්නේ දුම්රිය සේවාව. තමන්ගේ සේවා ස්ථානවලට පාවිච්චි කරන්නේ දුම්රිය සේවාව වන කොට තමන්ගේ වැඩ කටයුතු අවසන් වෙලා ඒ දුම්රියෙන් බැහැලා ඒ එන ජනතාව, සිය ගණන් ජනතාව පෝලිමේ එනවා බස් හෝල්ට් එකට. බස් හෝල්ට් එකට ඇවිල්ලා ඒ මගීන් සිය ගණනක් ඒ බස් හෝල්ට් එකට වෙලා බලාගෙන ඉන්නවා බස් එකක් එනතෙක්. එතකොට තේරුම් ගන්න ඕනෑ අපේ ප්‍රවාහන ඇමතිතුමනි, ඒ වෙලාව වන කොට දුම්රිය මගීන්ට අවශ්‍ය කරන සේවා සැපයුම ලබා දෙන්න පුළුවන් බස් සේවාවක් ඒ ස්ථානවලින් ආරම්භ කරන්න ඕනෑ. අවශ්‍ය බස් ඒ සේවා සැපයුම් ස්ථානයේ ඉඳලා. මෙන්න මේවා තමයි ක්‍රියාත්මක විය යුතු දේවල්. එහෙම නැතිව සම්ප්‍රදායික විධියට අපි කාල සටහනක් හදාගෙන පැය භාගයෙන් පැය භාගයට, පැයෙන් පැයට බස් යන එක නොවෙයි තිබෙන්න ඕනෑ. අපේ අවශ්‍ය කරන ක්‍රමවේදය අනුව, අවශ්‍ය කරන ඉල්ලුම අනුව, අවශ්‍ය කරන ජනතාවගේ අවශ්‍යතාවය අනුව අපි කාල සටහන වෙනස් කිරීමේ අවශ්‍යතාවය අපට පැන නගිනවා. ඒ නිසා මේ සියලු දේවල් ජනතාවගේ අවශ්‍යතාවය අනුව වෙනස් වෙන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ විශේෂයෙන්ම රාත්‍රී කාලයේ තමන්ගේ සේවය ඉවර වෙලා යන කාන්තාවන්ට ප්‍රවාහන පහසුකම් නැති වුණාම, රාත්‍රී කාලයේ තමන්ගේ සේවා කටයුතු කිරීමට විශාල මැළිකමක් දක්වනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම ගම්වල ජීවත් වන කාන්තාවන්ගේ රැකවරණය උදෙසා විශේෂ මාර්ග වැඩ සටහනක්, විශේෂ බස් සේවා වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය අපට මේ අවස්ථාවේදී ක්‍රියාත්මක කරන්න ඕනෑකම තිබෙනවා.

ඒ වාගේම අපි මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. පෞද්ගලික බස් සේවාව සහ රාජ්‍ය බස් සේවාව තුළ තිබෙන්නා වූ තරගකාරීත්වය මුදලට විතරක් සීමා කරන්නේ නැතිව, ජනතා අවශ්‍යතාවය තුළ ලාභයක්, පාඩුවක් සම විධියට බෙදා ගන්නා විධියට කාල සටහන සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පැන නගිනවා. ඒ නිසා පෞද්ගලික බස් සේවය සහ රාජ්‍ය බස් සේවය තුළ තමන්ට තිබෙන Peak Hours වලදී ලාභ ලබා ගන්න පුළුවන්. නමුත් තමන්ගේ බස් සේවාවට මගීන් අඩු වන අවස්ථාවේදී ලාභය නැති වෙන්න පුළුවන්. ලාභය පාඩුවක් වෙන්න පුළුවන්. එහෙම වුණත් මේ Peak Hours වලදී ලබා ගන්නා ලාභය තුළ ජනතාවට ඉතාමත්ම පහසු වැඩදායී ක්‍රමවේදයක් තුළ ඒකාබද්ධ කාල සටහනක් සකස් කිරීමේ අවශ්‍යතාවය සංශෝධනය කිරීම කාලෝචිත ක්‍රියාවක් කියන එක අපි මේ අවස්ථාවේදී දකිනවා. ඒ තුළ අපට පුළුවන් අපේ රාත්‍රී බස් සේවාව ලබා දීමේ - හැමදාම ඒ බස් සේවාව ලබා නොදුන්නත් සතියකට එක දවසක් හෝ දෙකක්, ඒ සේවාව කරන බස් රථවලින් එක දවසක් හෝ රාත්‍රී සේවයට අනිවාර්යය කිරීමේ අවශ්‍යතාවය තිබිය යුතුයි කියන එක යෝජනාවක් වශයෙන් මම මේ සභාවට ඉදිරිපත් කරනවා. ඒ නිසා අපට බස් සේවාව, එක රූට් එකට බස් 50 ක් තිබෙනවා නම්, ඒ බස් 50 න් සතියකට එක දවසකට බස් දෙකක් රාත්‍රී සේවයේ යෙදවීම තුළ ඒ මගීන්ට හෝ ඒ බස් හිමිකරුවන්ට පාඩුවක් වෙන්නේ නැහැ. ඒ නිසා මේවා පිළිබඳව අපේ ප්‍රවාහන අමාත්‍ය උපාලි කොඩිකාර අමාත්‍යතුමාගේ අවධානය යොමු කරලා, මම හිතන්නේ එතුමා හොඳ කාර්යශූර ඇමතිවරයෙක්. ඒ වාගේම ජනතාවගේ අදහස්, උදහස්වලට ගරු කරන අමාත්‍යවරයෙක්. ඒ වාගේම එතුමා උනන්දුවක් දක්වනවා මේ කර්තව්‍යය හොඳ ආකාරයෙන් ඉෂ්ට කිරීමට. කොපමණ එතුමාට දක්ෂතාවය තිබුණත්, හැකියාව තිබුණත් මම හිතන්නේ අපේ ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා කිව්වා වාගේ පෞද්ගලික බස් හිමිකරුවන්ගේ ආධිපත්‍ය තුළ, ඔවුන්ගේ තිබෙන්නා වූ ඒ ආධිපත්‍ය හැසිරීම තුළ එතුමාට මේ කර්තව්‍යය කිරීම අමාරු කර්තව්‍යයක් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ඒකාධිකාරී බලය අඩු කරලා මම හිතන්නේ අපේ අමාත්‍යතුමාට හොඳ පෞද්ගලික බස් සේවාවක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරන හයිය, ශක්තිය පළාත් සභා මන්ත්‍රීවරු වශයෙන් අපි සියලු දෙනා ලබා දීමට කැමැතියි කියන එක මම මේ ගරු සභාවේදී ප්‍රකාශ කරනවා.

ඒ වාගේම මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ට උප සභාපතිතුමා තමයි කුමාර වෙල්ගම අමාත්‍යතුමා. එතුමා තමයි ප්‍රවාහන අමාත්‍යවරයා. මම හිතන්නේ, අපට විශාල ආඩම්බරයක්. කළුතර දිස්ත්‍රික්කය තුළ නම් අපට මේ බස් සේවාව පිළිබඳව කිසිම අඩුවක් නැහැ. රාත්‍රී බස් සේවාවත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ඒක කළුතර දිස්ත්‍රික්කයට විතරක් සීමා වෙලා මදියි කියන එක තමයි අපි හිතන්නේ. මේ කර්තව්‍යය අනිකුත් දිස්ත්‍රික්කවලටත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට විශාල කැප කිරීමක් කරන අමාත්‍යවරයෙක් වශයෙන් එතුමා දිවා රාත්‍රී නොබලා, වෙහෙස මහන්සි වෙලා කටයුතු කරන අමාත්‍යවරයෙක් වශයෙන් අපට එතුමාව සලකන්න පුළුවන්. ඒ නිසා පොළොවේ පය ගහලා ජීවත් වන අමාත්‍යවරයෙක් වශයෙන් කුමාර වෙල්ගම අමාත්‍යතුමා මේ රාජ්‍ය බස් සේවාව ඉතාමත්ම කාර්යශූරව ක්‍රියාත්මක කරන බස් සේවාවක් බවට පරිවර්තනය කිරීමට විශාල මෙහෙවරක් ගන්නවා. ඒ නිසා මම මේ අවස්ථාවේදී යෝජනා කළ පරිදි ඉතාමත් කාර්යක්ෂම මගී ජනතා සේවාවක් ලබා දීමට අපි ත්‍රිමාන වැඩ සටහනක් තුළ - බස් රථ සේවාව, පෞද්ගලික බස් රථ සේවාව, දුම්රිය සේවාව තුළ ත්‍රිමාන වැඩ සටහනක් ක්‍රියාත්මක කරමුය කියන එක ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.24 ]

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ගරු සභාපතිතුමනි, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය ගෙනෙන ලද යෝජනාව සලකා බැලීමේදී එහි දෙවන ඡේදය පටන් ගන්නේ මේ අන්දමටයි. නමුත් පෞද්ගලික බස් සේවය පටන් ගත් පසු මගීන්ගේ ගෞරවය කෙළසා ගෙන එහි ගමන් කළ යුතු අතර, කොයි තරම් කාල සටහන් සකස් කර දුන්නත් ඒවා පිළිපදින අය ඉතාමත් අඩුයි.

එය කථා කරන්න මත්තෙන්, මගේ කථාවේ ආරම්භයත් එක්කම මම කැමැතියි මේ ප්‍රවාහනය කියන එක පිළිබඳව පුංචි අදහසක් ඉදිරිපත් කරන්න. ඇත්තටම ප්‍රවාහනය අර්ථ දැක්වීම තුළ තිබෙන්නේ, නිශ්චිත කාල සීමාවක් තුළදී නිශ්චිත ස්ථානයක සිට තවත් ස්ථානයකට සැප පහසුව, ආරක්ෂාකාරිව ගමන් කිරීමයි. ඒ අන්දමටයි ප්‍රවාහනය පිළිබඳව අර්ථ දැක්වෙන්නේ. ඒ වාගේම මේ රටේ තිබෙන ප්‍රධානම යටිතල පහසුකමක්. සමස්ත ක්‍රියා පද්ධතිය තුළ ඕනෑම සේවාවක හෝ වෙනත් නිෂ්පාදනයක මේ සියල්ල තුළ එකට ගැලී, බැඳී පවතින අනෙක් යටිතල පහසුකම තමයි ප්‍රවාහනය. ඒ නිසා මොන කාරණයක් පිළිබඳව සැලකුවත් ඒ හැම සංසිද්ධියක් එක්කම ප්‍රවාහනයත් සම්බන්ධ වෙනවා.

විශේෂයෙන්ම ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මුලින්ම උත්තරයක් දෙන්නට ඕනෑ. එතුමාගේ කථාවේදී කිව්වා, මධ්‍යම
[ ඩී.ඒ. චන්ද්‍රභානු ]

රජයෙන්, ප්‍රවාහන අමාත්‍යාංශයෙන් මේ බස් ගේන්නේ නැහැ. දේශපාලනයක් තිබෙනවා. මම එතුමාට මුලින්ම කියන්න ඕනෑ. 2002 අවුරුද්දේ පාස්කරලිංගම් ලේකම්තුමාව රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා පාවිච්චි කළේ, ලංකාවේ තිබුණු ලංගම රවී වෙත්තසිංහට විකුණන්නටයි. එලෙස විකුණන්නට සූදානම් කරපු කාලය පොඩ්ඩක් මතක් කරලා දෙන්න ඕනෑ. එදා තිබුණු වෘත්තීය සමිති නිසා තමයි ක්‍රියාත්මක කරන්න බැරි වුණේ. එහෙම වුණා නම්, ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණා නම් අද වන කොට මේ රටේ ලංගමයක් ඉතිරි වෙන්නේ නැහැ. ඔබේ නායකතුමා එවකට අගමැතිතුමා හැටියට ගත්ත ක්‍රියාව ඉෂ්ට වුණා නම්. ඒ නිසා ඔබතුමාට කියන්නට වර්තමානයේ කිසිම අයිතියක් නැහැ, කොහෙත්ම ආණ්ඩුව මේ බස් රථ වැඩි කරන්න එකඟ නැහැයි කියන එක.

විශේෂයෙන්ම වර්තමානයේ ලංකාවේ ලියාපදිංචි සහ ධාවනය වන බස් රථ ප්‍රමාණය සැලකුවාම, පෞද්ගලික අංශයේ බස් රථ 21,000 ක් විතර ලියාපදිංචි වෙලා තිබෙනවා. ලංගම දෛනිකව ධාවනය කරන්නේ, බස් රථ 4500 ක් විතරයි. ඒ 20,000 නුත් බස් රථ 7000 ක් ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ තමයි ලියාපදිංචි වෙලා තිබෙන්නේ. ඒ වාගේම රටේ ජන ගහනයෙන් 27% ක් ඉන්න පළාත හැටියට, රටේ ප්‍රධානතම පළාත හැටියට, ඒ වාගේම අනෙකුත් සියලු පළාත්වල ජනතාවට අවශ්‍ය කරන නිෂ්පාදන සහ සේවා පහසුකම් සපයන පළාතක් හැටියටත් බස්නාහිර පළාත් සභාව තුළදී විශේෂයෙන්ම මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ ලියාපදිංචි වෙලා තිබෙන මේ බස් රථ 7000 ක් විතර ප්‍රමාණය සඳහා විශාල කාර්යභාරයක් පැවරෙනවා. එහෙම නම් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව තුළ එක පැත්තකින් අපට කනගාටුවෙන් වුණත් කියන්න සිද්ධ වෙනවා, බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කාර්යභාරය මැනවින් ඉටු වෙලා නැති නිසා කියලා. ඒ නිසාවෙනුත් මේ කාරණාවට එය හේතු වෙනවාය කියන එක කනගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්න වෙනවා ගරු සභාපතිතුමනි. ඒකට හේතුවක් තිබෙනවා. දැන් ටිකක් හරි ඉඳලා හිටලා හරි රට දුවන්නේ ලංගම බස් එකක් විතරයි. බොහෝ ප්‍රදේශවල ධාවනය වෙනවා. නමුත් එය ප්‍රමාණවත් නැහැ. හැබැයි ලංගමත්, පෞද්ගලිකත් කියන ඒ බස් සේවාවන් දෙක ගත්තාම, එහි අනුපාතය ගත්තොත් 4000 ට 20,000 ක් කියන්නේ 1 ට 5 ක අනුපාතයක්. සාමාන්‍යයෙන් නම් 25% ට 75% කටත් වැඩි වෙනවා. 4000 යි 20,000 යි ගත්තාම. ඒ 20,000 ම දුවන්නේ නැහැ. රෙපෙයාර්වලටයි අරවාට මේවාට නවත්වන ප්‍රමාණය අඩු කළාම 1 : 4 විතර අනුපාතයකට තමයි පෞද්ගලික බස් රථ දුවන්නේ. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කාර්යභාරය ගත්තාම පර්මිට් නිකුත් කිරීම විතරක්ම නොවෙයි අයිති වෙන්නේ. බලපත්‍ර නිකුත් කිරීම විතරක් නොවෙයි. ධාවනය කරවීම, නියාමනය කරවීම මේ සියල්ල මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ රාජකාරී බවට පත් වෙනවා. එක පැත්තකින් අද මේ යෝජනාව තුළදී පළමුවෙන්ම කියවුණු ලොකුම දේ තමයි අපට තවම හඳුනාගන්නට බැරි වෙලා තිබෙනවා. පළාත් සභාව හැටියට, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය හැටියට මේ පළාතේ තිබෙන මගී අවශ්‍යතාවය. මගී අවශ්‍යතාවය වෙන් වෙන්ව කියන්න අමාරුයි. නමුත් බලපත්‍ර නිකුත් කළාට පළාතට සීමා වුණු මාර්ගවල අපි මගී අවශ්‍යතාව කොතරම්ද කියලා කවදාවත් දන්නේ නැහැ. කාගේ හෝ දේශපාලන අධිකාරියේ වෙනත් ක්‍රමවේදයක් තුළ හෝ මොනයම් ආකාරයට බලපත්‍රය නිකුත් කරනවා. බලපත්‍ර නිකුත් කළාට අපි කොහෙත්ම සොයා බලන්නේ නැහැ, මේ බලපත්‍රය අනුව දමන බස් රථය පාරට අවශ්‍යද නැද්ද කියලා. අපි කොතැනකවත් passenger demand එකක් බලන්නේ නැහැ. මගී ඉල්ලුමක් අපි කවදාවත් සොයලා නැහැ. ඒ වාගේම ඒ පාරේ දැනට ධාවනය වන බස් එකක AVU එක, Average Vehicle Utility එක සාමාන්‍ය වාහන උපයෝගීතාවය කවදාවත් බලන්නේ නැහැ. මේ නිසාවෙන් ජනතාවට තවමත් අවශ්‍යද? එහෙම නැත්නම් දැනට දුවන බස් එකක් දවසට කිලෝ මීටර් කීයක් දුවනවාද? සාමාන්‍යයෙන් දෛනිකව බස් එකක් කිලෝ මීටර් කීයක් ධාවනය කළ යුතුද? මේ කිසිම දෙයක් අපි සොයා බලන්නේ නැතිව අපි කියනවා මේකට අපි එක Route permit එකක් වත් දෙන්නේ නැහැ. නැත්නම් තවත් පැත්තකින් අපි හිතු මනාපයට Route permit නිකුත් කරනවා. මට මතකයි මම මීට කලින් අයවැය වෙලාවේදී ප්‍රවාහන අමාත්‍යාංශය ගැන කථා කරද්දී මම කිව්වා, Route Survey එකක් කරන්න කියලා. පාර පිළිබඳව තක්සේරුවක්, අධ්‍යයනයක් කරන්න. එහෙම කරලා ඒ පාරේ තිබෙන මගී ඉල්ලුම පිළිබඳව දැනුවත් වෙන්න. පළමුවැනි කාරණාව මගී ඉල්ලුම පිළිබඳව දැනුවත් වෙන්නේ නැතිව අපට

පුළුවන්කමක් නැහැ ඒ පාරේ අවශ්‍යතාවය සොයා බලන්න. ඒ නිසා මම ගරු සභාපතිතුමා මඟින් ගරු අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. අනිවාර්යයෙන්ම බලපත්‍ර නිකුත් කරන්න. එහෙම නැත්නම් බලපත්‍ර නවත්වන්න. මේ සියල්ලට ඉස්සරවෙලා ඒ පාර පිළිබඳව සමීක්ෂණයක් කරන්න.

අනික් කාරණය තමයි එක පැත්තකින් අපි සොයා ගෙන යන කොට අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය කිව්වා බස් කොට කොටා යනවා. එහෙම නැත්නම් එක පැත්තකින් බස් ඉගිල්ලිලා යනවා. මෙහෙම වෙන්නේ ඇයි? මෙහෙම තරඟයක් වෙන්නේ ඇයි? බොහෝ වෙලාවට බස් කොට කොටා යන්න හේතු වෙලා තිබෙන්නේ, ඒ පාරට අවශ්‍ය කරන බස් ප්‍රමාණයට වඩා වැඩි බස් ප්‍රමාණයක් මාර්ගයට ඇතුළත් වෙලා තිබෙන නිසයි. ඒ නිසා ධාවකයින් අතර ලොකු තරඟයක් ඇති වෙනවා. විශේෂයෙන් ලාභය පරමාර්ථ කර ගෙන. සමහර වෙලාවලදී බස් එක පිටත් වුණු තැන ඉඳලා - මොකද, පාරකට බස් රථ යොදන්න ඕනෑ අවම අවශ්‍යතාවය මතයි. උපරිමය ගන්න ගියොත් එක පැත්තකින් විදේශ විනිමය. එක පැත්තකින් පරිසර දූෂණය. ශබ්ද දූෂණය. ඒ වාගේම පාරේ අනවශ්‍ය තදබදය. මේ සියල්ලටම හේතු වෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම අවම අවශ්‍යතාවය තමයි පාරකට අවශ්‍ය කරන අවම බස් රථ ප්‍රමාණය යෙදවීම. වැඩි ප්‍රමාණයක් යෙදවූ ගමන් අනිවාර්යයෙන් ඔය කොට කොටා යාම, එහෙම නැත්නම් ඉගිල්ලීමේ තරඟය නවත්වන්න බැරි වෙනවා. ඒ නිසා අපට මේ තත්ත්වය උදා වෙලා තිබෙන්නේ, එක පැත්තකින් අර කියාපු ආකාරයේ මාර්ග සමීක්ෂණයක්, මඟී ඉල්ලුම පිළිබඳව දැනුවත් වීමක් වෙලා නැති නිසයි.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, දැන් රාත්‍රී සේවාවන් බැලුවාම පෞද්ගලික අංශයෙන් රාත්‍රී සේවාවන් ක්‍රියාත්මක වෙන්නේ නැහැයි කියන චෝදනාව තිබෙනවා. ඇයි මෙහෙම වෙන්නේ? එක පැත්තකින් තවමත් අපට ඒකාබද්ධ කාල සටහන් ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබෙනවා. ඒකාබද්ධ කාල සටහනක් ක්‍රියාත්මක වෙනවා නම් බොහොම පැහැදිලිව අපට පුළුවන්කම ලැබෙනවා. ඒ ලංගමෙන් වාර කීයක් යන්න ඕනෑද? 40 : 60 අනුපාතයට ගත්තොත් සමහර විට අපට වඩා ඉස්සරහායින් ඉන්නවා. 2:3 අනුපාතයට අපි ධාවනය කළොත් අනිවාර්යයෙන්ම චක්‍රීය කාල සටහන් ක්‍රමයක් ක්‍රියාත්මක කළොත් අපට පුළුවන්කම ලැබෙනවා ඒ චක්‍රීය කාල සටහන් ක්‍රමය තුළදී ඒ චක්‍රීය වන ආකාරයටම රාත්‍රී බස් රථ දුවන්නට. එය ක්‍රියාත්මක නොවීම නිසා තමයි මේ තත්ත්වය දැඩි ලෙස බලපාලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම බොහෝ වෙලාවට අද මේ මාර්ග තදබදය පාරට විතරක් බලපාන්නේ නැහැ. අනවශ්‍ය විධියට දැන් අපේ අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරපු විධියට අපට පුළුවන්කමක් තිබෙනවා නම්, විශේෂයෙන්ම Peak Hours වලදී, විශේෂයෙන්ම වැඩි මහජන ඉල්ලුමක් තිබෙන වෙලාවේදී බස් රථ ධාවනය කරන්න. උදාහරණයකට ගන්න කළුතර - කොළඹ බස් කීයක් තිබෙනවාද? තමන්ගේ ගමන් වාරය දුවලා, දවසට ට්‍රිප් එක හරි දෙක හරි දුවලා හවසට සමහර වෙලාවල්වලදී ඒ බස් එක ගෙදර ගිහිල්ලා Park කරනවා. නමුත් අපට පුළුවන් නම් ඒ බස් එක හවසට කෝච්චියෙන් බැහැලා එන මිනිස්සුන්ට, වැඩිම Passenger Demand එකක් තිබෙන වෙලාවට, මඟී ඉල්ලුමක් තිබෙන වෙලාවට ඒ බස් එකට අවස්ථාවක් දෙන්න. අර කෝච්චියෙන් බැහැලා එන මඟීන් ටික ආසන්න ප්‍රදේශවලට ගෙනියන්න. ඒ වාගේම අනික් පැත්තෙන් බලන්න. සමහර වෙලාවලදී කොළඹ නගරයේ, එහෙමත් නැත්නම් වෙනත් පාරවල් දවල් කාලයට සමහර වෙලාවලදී තව තවත් පර්මිට් ඉල්ලනවා. ඒත් ඇත ඉඳලා කොළඹට එන බස් එකක්, සමහර වෙලාවලදී අවිස්සාවේ ඉඳලා කොළඹට එන බස් එක උදේ ට්‍රිප් එක ආවාට පස්සේ උදේ හතරට අවිස්සාවෙන් ආවා නම් හත හතහාමාරට කොළඹට එනවා. ඊට පස්සේ ඒ බස් එක ආපහු හැන්දෑවට යන්නේ. හවස පහට විතර තමයි මෙහෙන් ගමන ආරම්භ කරන්නේ. ඒ දක්වා බස් එක Idling. බස් එක වැඩ කරන්නේ නැහැ. එතකොට අපට පුළුවන්කම ලැබෙනවා ඒ වාගේ බස් එකක් ඕනෑ නම් කෙටි ධාවනයකට යොදවන්න. නගරයේ දවල්ට පාසල් ඇරෙන වෙලාවට, එහෙම නැත්නම් වැඩිපුර මඟී ඉල්ලුමක් තිබෙන වෙලාවට ඒක ධාවනය කරවන්නට. ඒ නිසා මේ කරුණු පිළිබඳව අපට අනිවාර්යයෙන්ම අදහස් යොමු කරන්න වෙනවා. අනික් ප්‍රධානම කාරණය තමයි දැන් බස් එකක සේවාව ලබා දෙන කොට පළමුවෙන් වෙලා තිබෙන්නේ, බස් එක කරන්නේ මඟී ආසන විකිණීමක්. මේ සේවාව තුළදී නිෂ්පාදන ආයතනයක් නම්, භාණ්ඩ නිෂ්පාදනය කරලා විකුණනවා. නමුත් මඟී ප්‍රවාහනයේදී කරන්නේ මඟී ආසනය විකිණීමක්. භාණ්ඩයක් ගබඩා කරලා තියන්න පුළුවන්. ඉදිරියේදී උත්සව කාලයට විකුණන්න. හැබැයි, මඟී ආසනය විකිණීම ඒ ක්‍රමවේදය නොවෙයි. මඟී ආසනය විකුණනවා කියලා කියන්නේ, ආරම්භක අවස්ථාවේ ඉඳලා අවසානය දක්වා නිශ්චිත කාල සීමාවේදී ඒ ආසනය විකුණා ගන්න ඕනෑ. ඒකට මඟියෙක් දා ගන්න ඕනෑ. එහෙම නොවුණොත්, ඒ කාලය පහුවෙනවාත් එක්කම, ඒ Section එක පනිනවාත් එක්ක මඟී ආසනය විකුණා ගන්න බැරි වෙනවා. විශේෂයෙන්ම මම ඒකයි කිව්වේ, සමීක්ෂණයක් කරලා මඟී ඉල්ලුම පිළිබඳව අධ්‍යයනයක් කිරීමෙන් අනතුරුව තමයි නිසියාකාරව ඒ මඟී ආසනය විකුණා ගන්න පුළුවන් වෙන්නේ. අද අනික් පැත්තෙන් විශේෂයෙන්ම රජයේ පැත්ත වාගේම පෞද්ගලික අංශය අපේ 60% ක්, 75% ක් විතර ආසන්න දායකත්වයක් දෙන මඟී ප්‍රවාහනයේදී, පෞද්ගලික ක්ෂේත්‍රය ගත්තාම මහා තරඟයක් ඇති වෙලා තිබෙනවා. එයට එක හේතුවක් වෙලා තිබෙන්නේ අවම ආයෝජනයක් එක්ක, තමන්ගේ අවම ප්‍රාග්ධනයක් යොදවලා වැඩි මුදලක් ෆිනෑන්ස් සමාගම් හරහා ලබා ගෙන මහා ඉලක්කයක් කරා හඹා යන්න උත්සාහ කිරීමයි. එතැන්දී තිබෙන නීති රීති, එහෙම නැත්නම් වෙනත් ඒ සියලු දෙය උල්ලංඝනය කරමින්, ලාභය පෙරදැරි කර ගෙන එය දඩමීමා කර ගෙන ධාවනය කිරීමක් තමයි සිද්ධ වෙන්නේ.

දැන් මේ වාගේ දේවල් පිළිබඳව අවධානය යොමු වෙන්නට ඕනෑ.

ඒ වාගේම අනෙක් ප්‍රධාන කාරණය හැටියට ලංගමය ගත්තත්, රාත්‍රි සේවාව වෙනුවෙන් ඉස්සර ලංගමයට රජයෙන් හුභාක් ආධාර ලැබුණා. ආර්ථික නොවන මාර්ගවලට මෙන්ම, රාත්‍රි සේවාවන්වලට. නමුත් වර්තමානයේ ලංගමයට ඒ පැත්තෙන් ලැබෙන ආධාරත් අඩු වෙලා තියෙනවා. ඒ නිසා සමහර විට දවල් කාලයට 40 : 60 අනුපාතයට, 25 : 75 අනුපාතයට දුවන පෞද්ගලික බස් රථය රෑ වෙන කොට පාරෙන් ඉවත් වෙනවා. ඒ නිසා දවල් කාලයේ දුවන ඒ අයිතිවාසිකම්ම රාත්‍රියටත් ඇයි අපට ධාවනය කරවන්න බැරි? එහෙම කළොත් පළාත් සභාවක් හැටියට අපෙන් කෙරෙන යුතුකම, මහජනතාවට ඒ සේවාව ඉෂ්ට වෙනවා. ඒක අනිවාර්යයෙන්ම අපි ක්‍රියාත්මක කරන්නට ඕනෑ. එහෙම නොවෙන්නට මම හිතන්නේ කවදාවත් මේ අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය හරහා එන ප්‍රදේශයේ මඟී ජනතාවගේ ඉල්ලීමට ඇහුම්කන් දෙන්න බැරි වෙනවා. ඒ නිසා අනිවාර්යයෙන්ම මනා නියාමනයක් තුළින් පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය ක්‍රියාත්මක කරවන්න වෙනවා. අද බලන්න සමහර වෙලාවට - අද මේ යෝජනාව ගන්න කොට අපේ පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියේ එකම නිලධාරියෙක්වත් අද මේක නිරීක්ෂණය කරන්න මේ වන විට ඇවිල්ලා ඉන්නවාය කියලා මම හිතන්නේ නැහැ.

[ ඩී.ඒ. චන්ද්‍රභානු ]

ඒ වාගේම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාව දැනුවත් කරන්න වෙනවා. බලපත්‍ර නිකුත් කිරීමට අමතරව, නියාමනය කිරීම, නිසියාකාරව ධාවනය කිරීම මේ කටයුතු පිළිබඳවත් නැවත නැවතත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ. ඒ නිසා මම හිතන්නේ, ඉදිරියේදී ශ්‍රී ලංගම බස් ගෙන්වනවා වාගේම, බස් Assemble කරන්න, ඒ කියන්නේ දේශීය අමු ද්‍රව්‍යයත් යොදා ගෙන බස් සවි කරන්න වැඩ පිළිවෙළක් ලැහැස්ති කරලා තියෙනවා. මම හිතන්නේ ඉදිරියේදී එය ක්‍රියාත්මක වෙයි. එවිට මාර්ගයට තව බස් රථ තුන්දහසකට ආසන්න ප්‍රමාණයක් ලබා දීමේ අදහසක් තියෙනවාය කියන එක පුවත්පත්වලින් දැකලා තියෙනවා. එහෙම වුණොත් තව හුභාක් දුරට මේ ප්‍රශ්නවලිනුත් නිදහස් වෙන්න අවස්ථාව ලැබෙයි. ඒ කොහොම වෙතත් -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ප්‍රවාහන ඇමතිතුමාගේ ලේකම්තුමා. කළුතරට විතරයි බස්. අනික් ප්‍රදේශවලට නැහැ.

**ගරු ඩී.ඒ. චන්ද්‍රභානු**
Hon. D.A. Chandrabhanu

ඒක අදාළ අය කරයි. ඔබතුමා පැත්තකින් ඉන්න. ඔබතුමාට අදාළ නැහැ නේ ඒක. ඒක අදාළ විධියට හරියාකාරව බෙදලා දෙයි. ඔයගොල්ලෝ බස් ටික විකුණන්න කථා කරපු කට්ටිය නේ? රවි වෙත්තසිංහට දෙන්න කථා කරපු කට්ටිය නේ? පාස්කරලිංගම් හරහා රවි වෙත්තසිංහට දෙන්න තමයි 2002 ලැහැස්ති වුණේ. ඒක දුන්නා නම් අද ලංගමක් ගැන කථා කරන්න හම්බ වෙන්නේ නැහැ. හැමදාමත් තිබුණු රාජ්‍ය දේපළ විකුණලා, ලැජ්ජා නැතුව මෙතැන ඇවිල්ල රාජ්‍ය දේපළ ගැන කථා කරනවා. ඒවා ගැන කථා කරන්න මෙතුමාට අයිතියක් නැහැ. මේගොල්ලෝ තමයි හැම දේම වික්කේ. එහෙම විකුණපු පක්ෂයක කොටස් කාරයෝ හැටියට මෙතුමාට අයිතියක් නැහැ කථා කරන්න. ලංගමය විකුණන්න හදලා, රවි වෙත්තසිංහගේ බූදලය තර කරන්න හදලා කර ගන්න බැරුව දැන් ලංගමය ගැන කථා කරනවා. කොහොමත්ම එහෙම අයිතියක් නැහැ. ඒ නිසා කාලවේලාව ඉක්ම වී ඇති නිසා ඉතාමත් හොඳ කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියට මාගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා බොහොමත්ම ස්තුතියි.

[ අ.භා. 12.39 ]

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා කොන්ද කෙලින් තියා ගෙන යෝජනාවක් ගෙනාපු එක ගැන.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

එයාගේ කවදත් කොන්ද කෙලින් තමයි.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

කොන්ද කෙලින් තමයි. ඒ කියන්නේ එතුමිය කිව්වා එදා C.T.B. බස් එකෙන් පළාත් සභාවට ආවයි කියලා. ඉතින් මම දන්නවා ඒ හොඳම කාලය. මම කියන්නේ C.T.B එකට. නැත්නම් බස් සේවයට. මඟී ගමනාගමන සේවයට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලය තමයි හොඳම කාලය. හොඳම ප්‍රවාහන කාලය. (බාධා කිරීම්) නමුත් ඒ කාලයේ ඔබතුමියටඋෂ්ණයක් හරි වැදෙන්න ඇති මුල් Period එකේ. ඒ නිසා ඒකේදී ගොඩාක් සන්තෝෂ වෙනවා. කෙලින් කිව්වා, එදා මම ආවා බස් එකේ. අද බස් එකේ එන්න බැරි තත්ත්වයක් උදා වෙලා තියෙන හින්දයි මේ යෝජනාව ගෙනාවේ. (බාධා කිරීම්)

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1977 බලය ගන්න කොට බස් සේවාව අන්තයටම කඩා වැටිල තිබුණේ. දැඩි

දේශපාලනීකරණය වෙලා. දේශපාලන රැස්වීම්වලට තමයි බස් යන්නේ. C.T.B. බස් –

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

අනිල් මුණසිංහ හදපු බස් ටික කැවේ U.N.P. එක.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

වටේම තියෙන්නේ C.T.B බස්.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

අනිල් මුණසිංහ හදපු ලංගමයේ බස් ටික.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

දේශපාලන හෙංචයියලා ටිකක් බිහි කරපු තැනක් තමයි එදා. (බාධා කිරීමක්) දැනුත් ඒකයි. ආයේ ආපහු ආවා. නමුත් එතුමිය එදා යම්තම් ඒ කාලේ බස් එකේ හොඳට යන්න පුළුවන්කම ලැබීම ගැන ඇත්තටම සන්තෝෂ වෙනවා.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

මම හැමදාම බස් එකේ ගියේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

නමුත් දැන් එන්න බැහැ. ඒ කඩා වැටීම දැක්කාට පස්සේ තමයි පෞද්ගලික බස්කරණය ඇති කළේ. මේ ප්‍රවාහන සේවය ක්ෂණිකව වැඩිදියුණු කිරීමකට උත්තරයක් වශයෙන් තමයි පෞද්ගලික බස් සේවය ඇති කළේ. එදා 1977 න් පස්සේ හොඳට බස් දුවන්න පටන් ගත්තා. ප්‍රශ්නයක් නැහැ. අද වන කොට ගරු සභාපතිතුමනි, ඔබතුමාත් දන්නවා. ඔබතුමයි මමයි එක නගරයේ ජීවත් වෙන්නේ. Station එක ගාවට ගියොත් ගම්පහ හැන්දෑවේ හයෙන් හතෙන් පස්සේ Station එක ගාව මොන තරම් සෙනගක් ඉන්නවාද? බස් එකකට ගොඩ වෙන්න බැරුව. ඒ තත්ත්වය උදා වෙලා තිබුණා. ඔබතුමියට ඇත්තටම ස්තුතිවන්ත වෙනවා, මේ යෝජනාව ගෙනාපු එක ගැන. මම හිතනවා මෙය බස්නාහිර පළාතේ නොවෙයි, ලංකාවේම තියෙන ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පොඩ්ඩක් ඉන්න. මට කියන්න –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කාලය දෙනවා ඇමතිතුමා. ඔබතුමා පස්සේ උත්තර දෙන්න ඒකට.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඇත්තටම ගරු සභාපතිතුමනි, මේ හැන්දෑවේ හයෙන් හතෙන් පස්සේ Bus Halt එකට ගියාම - ගම්පහ Station එකට ගියාම - Bus Halt එකේ ඉන්න අය අහනවා පළාත් සභාවෙන් කරන්නේ Bus Halt හදන එක විතරද කියලා. මොකද? අපේ ඇමතිතුමාගේ නම තමයි හැම Halt එකේම ගහලා තියෙන්නේ, බස් නැති වුණාට. ඒ ගොල්ලෝ හිතන්නේ පළාත් සභාව කරන්නේ Bus Halt හදන එක කියලා. වෙන දෙයක් කරන්නේ නැහැ කියලා. හැම Halt එකේම ගහලා තියෙනවා අපරාදේ කියන්න බැහැ. ඉතින් කොහොම වුණත් ඇත්තටම මේකට හේතුව වෙලා තියෙන්නේ, අක්‍රමවත් පාලනය. හොඳ පාලනයක් එදා තිබුණා. දැන් පාලනය අන්තිමට ගිහිල්ලා. කලින් කථා කළ මන්ත්‍රීතුමා ඒක පැහැදිලි කරලා තිබුණා. Route Permit ඕනෑ ඒවාට Permit දෙන්නේ නැහැ. Route Permit ඕනෑ නැති ඒවාට Permit දෙනවා. ඒ කියන්නේ බස් ඕනෑ තරම් තියෙනවා. මොකද, ඒවාට තමයි වැඩි ගණනක් කොමිස් ගෙවන්නේ. දැන් සෙනග පිරිලා යන බස් වලින් තමයි කොමිස් එක හම්බ වෙන්නේ, Route Permit එකක් දුන්නාම. ඒවට තව තව Permit issue කරනවා. අර අපේ පැත්තේ Petrol Shed වාගේ තමයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සභාපතිතුමාත් දන්නවා ඒවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

දන්නවා ඒවා. ඒ වාගේ බස්වලටත් ඒක තමයි වෙලා තියෙන්නේ. සෙනගට යන්න බැරි බස් එකක් නැති තැන්වලට Route Permit issue කරන්නේ නැහැ. ඒක තමයි පළමුවැනි ප්‍රශ්නය වෙලා තියෙන්නේ.

ඒ වාගේම අක්‍රමිකතාවය. නාස්තිය. අද කවුරුත් සන්තෝෂ වෙන්නේ නැහැ. බස් මගීන් සන්තෝෂයෙනුත් නැහැ. පෞද්ගලික බස් හිමියෝ සන්තෝෂයෙනුත් නැහැ. C.T.B එකේ ඉන්න කණ්ඩායම නැත්නම් සේවකයෝ සන්තෝෂත් නැහැ. C.T.B කිව්වාම බැංකුවකින් Loan එකක් දෙන්නේ නැහැ. C.T.B එකේ වැඩ කරනවාය කිව්වාම කිසිම රජයේ බැංකුවකින් Loan එකක් දෙන්නේ නැහැ. ඒ තත්ත්වයට ප්‍රවාහන සේවය අද පත් වෙලා තියෙනවා. මම අහල බැලුවා. ඒ අයගේ අවුරුදු දෙක තුනක අර්ථ

සාධක ගෙවලා නැහැ. C.T.B එකේ අවුරුදු දෙක තුනක අර්ථසාධක ගෙවලා නැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා – විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ලේකම්තුමා නැහැ. ගිහිල්ලා. Man මාරු.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගිහිල්ලා. අර්ථසාධක ගෙවලා නැහැ අවුරුදු දෙක තුනක. තවම මාර්තු මාසේ පඩි ගෙවලා නැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා – විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

ඇමතිතුමාට බැරි නම් ලේකම්තුමාට කියන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

තවම C.T.B එකේ මාර්තු මාසේ පඩි ගෙවලා නැහැ. ඉතින් මේ කඩා වැටීම තුළ කවුද සන්තෝෂ වුණේ? බස් මගියා සන්තෝෂත් නැත්නම්. පුද්ගලික බස් අයිතිකාරයෝ සන්තෝෂත් නැත්නම්. රජයේ බස් සේවකයෝ සන්තෝෂත් නැත්නම්. කවුද සන්තෝෂ වුණේ? අන්තිමට බැලුවාම කවුරි කොමිස් ගන්න කණ්ඩායමක් තමයි සන්තෝෂ වෙලා තියෙන්නේ. මොකද, අර පාරවල් කාපට් කරනවා වාගේ තමයි. පාරවල් කාපට් කරනවා. හැබැයි කැඩුණු පාරවල් හදන්න කවුරුවත් නැහැ. අලුත් පාරවල් කාපට් කරන්න හෝ ගාලා කට්ටිය ඉන්නවා. ඉල්ලීමුත් වැඩියි. මන්ත්‍රීතුමාලාත් – ඔබතුමාත් රැස්වීමක කිව්වයි කිව්වා, පාරවල්

[ ගරු අජිත් මාන්නප්පරෙුම ]

කොන්ක්‍රීට් කරන්න මන්ත්‍රීවරු කලබල වෙනවා කියලා. නමුත් කැඩුණු පාරවල් හදන්න කවුරුවත් නැහැ. ඒ වාගේ තමයි කැඩුණු බස් හදන්න කවුරුවත් නැහැ. අලුත් බස් ගෙන්වන්න අය ඕනෑ තරම් ඉන්නවා. දැන් බලන්න. ගම්පහ දිස්ත්‍රික්කය තුළ බස් දෙසීයකට වැඩිය කැඩිලා. ගම්පහ දිස්ත්‍රික්කය තුළ C.T.B ඩිපෝවලට ගිහිල්ලා බලන්න. බස් දෙසීයකට වඩා ගාල් කරලා තියෙනවා, ධාවන තත්ත්වයට නුසුදුසුයි කියලා. සුනාමියෙන් හම්බ වුණු Hino බස් රථ සියයට 90 ක් ධාවන තත්ත්වයෙන් අයින් කරලා. සුනාමිය නිසා අපට අත් වුණු ප්‍රතිලාභ. ජපන් හොඳ බස් වගයක් හම්බ වුණේ. Hino බස් ටික. අද 90% ක් පැත්තකට අයින් කරලා දාලා. අලුත් බස් ගන්න යන්න ඕනෑ නැහැ. අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය කියන කථාවට එකඟයි. හැන්දෑවේ හයෙන් පස්සේ C.T.B බස් ටික දාන්න. මේවා ටික හදන්න. අලුත් බස් ගෙන්වන්න එපා. අලුත් බස් එකක් ගේන කොට කැඩුණු ටික හදලා බස් දහයක් පාරට දාන්න පුළුවන්. නිට්ටඹුව ඩිපෝවට ගිහිල්ලා බලන්න ගරු සභාපතිතුමනි, ගාල් කරපු බස් හතළිහකට, පණහකට වැඩිය තියෙනවා. කොට උඩ තියපුවා. මේවා හදන්නේ නැහැ. එහෙම නම් විශේෂයෙන්ම අපි දකිනවා. ක්‍රමවත් වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. පළමුවැනි දේ අපි දකිනවා. ධාවන ක්ෂේත්‍රයේ සිටින බස් විතරක් නොවෙයි. ලොරි. කාර්. ටැක්සි. ත්‍රී වීල්. ධාවන ක්ෂේත්‍රය අන්තිමටම කඩාගෙන වැටිලා. මොකද හේතුව? දවසින් දවස ඩීසල් වැඩි වෙනවා. ලෝක වෙළඳ පොලේ ඩීසල් අඩු වෙනවා. ලංකාවේ ඩීසල් වැඩි වෙනවා. මේක මහ පුදුම කතන්දරයක්.

අර එක පාරක් ඇමතිවරයෙක් නම් කිව්වා, ලෝක වෙළඳ පොලේ ප්ලග් එක ගලවන්න ඕනෑය කියලා. ලෝක වෙළඳ පොලේ තියනෙ ප්ලග් එක ගලවලා දැම්මාම හරි කියලා. දැන් ප්ලග් එක ගලවලා. ඉස්සර ප්ලග් එක ගහලා තියෙන කාලේ ලෝක වෙළඳ පොලේ වැඩි වෙන කොට අපේ වැඩි වුණා. ප්ලග් එක ගහලා නේ තිබුණේ. දැන් ගැලෙව්වාට පස්සේ ලෝක වෙළඳ පොලේ අඩු වන කොට අපේ එක වැඩි වෙනවා. ප්ලග් එක ගලවලා හින්දා. ඒ වාගේ තත්ත්වයකට පත් වෙලා තියෙනවා. දැන් විදුලියත් ඒ වාගේ නේ? විදුලියටත් වෙලා තියෙන්නේ, ඉන්ධන වියදම අඩු වෙනවා. රටේ විදුලිය වැඩි වෙනවා. රටේ ඩීසල් වියදම වැඩියි. ඉන්ධන වියදම වැඩියි. ඒ නිසා මනා පරිපාලනයක් නැතිවීම තමයි මේකට හේතුව. කෙසේ වෙතත්, පරිපාලනය – ඇත්තටම චන්ද්‍රභානු ගරු මන්ත්‍රීතුමා හරියටම මේක පැහැදිලි කරලා දුන්නා. පරිපාලනයක් නැතිවීම ගැන එතුමා බෙහොම ලස්සනට පැහැදිලි කරලා දුන්නා. මේක තමයි ප්‍රශ්නයට හේතුව වෙලා තියෙන්නේ කියලා.

**ගරු උපාලි කොඩිකාර – අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

එතුමා නේ ලේකම්

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ඒක තමයි. ඔබතුමාට උත්තර දුන්නේ.

**ගරු උපාලි කොඩිකාර – අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මගේ නොවෙයි. C.T.B. එකේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

එතුමා යන්න ගියා නේ? ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා ගරු අශෝකා ලංකාතිලක මැතිනිය ගෙනාපු යෝජනාව ඉතාමත්ම කාලෝචිතයි. ඒක විය යුතුයි. ඒ නිසා අපෙන්, පුද්ගලික බස් වලින් යම් ගණනක් ගෙවලා හරි – ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා. C.T.B. එකට ගෙවලා හරි හැන්දෑවේ පහේ සිට කාලසටහන C.T.B. එකට හදන්න. ඕනෑ නම් බස් රථවලට ගානක් – දවල් දුවන බස් රථවලින් ගණනක් ගත්තත් කමක් නැහැ. දැනටත් ගන්නවා නේ? ඒ වාගේම අපි දකිනවා

අසංතෘප්තතාවය නිසා - මම හිතන්නේ පොලිස් නිලධාරීන්ගේ මාර්ග බාධක බොහොම තියෙනවා. ප්‍රයිවට් බස් කියපු ගමන් අල්ලනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ. ප්‍රයිවට් බස්වලත් යම් drivers ලට කොන්දොස්තරලාට යම් ක්‍රමවේදයක් හරි ගස්සන්න ඕනෑ. විනය මාර්ගයක්. අඩුගානේ සමහර බස් රියදුරෝ ඉන්නවා පාන්දර තුනට පටන් ගත්තාම රෑ දොළහ වෙනකල් දුවනවා. ඉතින් මාර්ග අනතුරු වෙන එක අහන්න දෙයක්ද? එක දවසක් නිවාඩු දෙනවා. නමුත් පැය විසි හතරේම වාගේ පාරේ දුවනවා. ඉතින් දකින එක්කෙනා ගැනත් වෛරයකින් තමයි ඒ අය කටයුතු කරන්නේ. අන්න ඒ වාගේ තත්ත්වයක් තියෙන නිසා ඒකටත් යම් ප්‍රමිතියක් හදන්න පුළුවන් නම් හොඳයි. ප්‍රයිවට් බස් රියැදුරන්ටත් ප්‍රමිතියක් ඇති කරන්න පුළුවන් නම් හොඳයි. හැබැයි, 77 තීන්දුව අනුව ප්‍රයිවට් බස් නොකරන්න අද මිනිස්සුන්ට ඉන්න හම්බ වන්නේ ගස් යට තමයි. නැත්නම් අර හදපු බස් හෝල්ට් එකක් යට තමයි.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

දන්න තරම තමයි

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

මට මතකයි. අපි ටියුෂන් පන්ති යන කාලයේ ප්‍රයිවට් බස් තිබුණේ නැහැ. එතකොට බස් එකක් මිස් වුණොත් එහෙම තවත් බස් එකක් එන කල්, පැයක් විතර ඉන්න ඕනෑ. නමුත් ඊට වැඩිය බස් සේවාවක් තියෙනවා. ප්‍රයිවෙට් බස් ඇවිදින් තියෙන නිසා ඒ අඩුව මැකිලා තියෙනවා. නමුත් මේක ක්‍රමවත් වෙලා නැහැ. මෙතැන පරිපාලනයක් අවශ්‍යයි. නිවැරදි පරිපාලනයක් අවශ්‍යයි. (බාධා කිරීමක්) ඒ නිසා විශේෂයෙන්ම අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙමින් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා දැඩි අවධානය යොමු කරන්න. පළාත් සභාව මගින් දැඩි බලපෑමක් මහ ආණ්ඩුවට ඇති කරලා C.T.B. එක හැන්දෑවේ 05 හේ සිට රාත්‍රි 11 දක්වා ධාවනය ගැන වගකීම ගත යුතුයි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.49 ]

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම අශෝකා ලංකාතිලක ජ්‍යෙෂ්ඨ ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා මෙවැනි යෝජනාවක් අපේ සභාවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම ගැන. අද වාගේ දිනක. අද මේ කථා කරන මන්ත්‍රීවරු ඔක්කෝම දන්නවා එහා පැත්තෙන් මට විරුද්ධව උපවාස යනවා. පෞද්ගලික බස් රථ හිමියන්ගේ කණ්ඩායම්. මේකේ තියෙන අමාරුව, බැරෑරුම්කම, මේකේ තියෙන ගැටලු සහගත තත්ත්වය මේ එක මන්ත්‍රීවරයෙක්වත් දන්නේ නැහැ. මම කනගාටු වෙනවා සභාවේ නැති එක ගැන. මේ ප්‍රශ්නවලට උත්තර ගන්න, මේවා තේරුම් කර ගන්න. මෙවැනි මාතෘකාවක් ගැන සභාවට කථා කරන්න ඉස්සර වෙලා විවාද කරන්න ඉස්සෙල්ලා මේ කරුණු අපෙන් ගන්න ඕනෑ. මේ අධිකාරියෙන් ගන්න ඕනෑ. එතකොට අද ලංකා ගමනාගමන මණ්ඩලය කිව්වාම ඒ කාලේ ඉතාම හොඳ සේවාවක් රටට ඇති කළා. අඩුම ගානේ කිව්වොත් කසාදයක් බඳින්න පත්තරේ දැම්මාම ගෙදර ඉන්න දරුවෙක්ව දුන්නේ ලංකා ගමනා ගමන මණ්ඩලයේ වැඩ කරන සේවකයෙකුට තමයි. රටේ එච්චරට දියුණුවක් තිබුණා. ලංගමය කිව්වාම එදා ප්‍රවාහන සේවය සම්බන්ධව. අද මාන්නප්පෙරුම මැතිතුමා කිව්වා එක්සත් ජාතික පක්ෂය පෞද්ගලීකරණය කළ නිසා යම්තම් බේරුනා කියලා. එක්සත් ජාතික පක්ෂය පෞද්ගලීකරණය කළ නිසා තමයි අද මේ බස් සේවාව සම්පූර්ණයෙන් අක්‍රමවත් වුණේ. මගියාට යන්න පුළුවන්කමක් නැහැ. පුද්ගලික අංශයට මේ ගැටලු සහගත තත්ත්වයකට විසඳුම් ගේන්න පුළුවන් කමක් නැහැ. අද බලන්න, ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් 4700 ක් තියෙනවා. දැන් ඒකාබද්ධ කාල සටහන් ගැන කථා කරනවා. අපේ ඇමතිතුමාගේ ලේකම්තුමාත් කථා කරනවා. පුදුම වැඩේ. ඒ ගොල්ලෝ Withdraw වෙනවා මේකෙන්. ඒකාබද්ධ කාලසටහන් ගැන කථා කරන්න පුළුවන්කමක් නැහැ. අපේ බස් 7000 ක් තියෙනවා. මාර්ග 570 ක් තියෙනවා. එතකොට C.T.B එකත් එක්ක දුවන්න පුළුවන් වෙන්නේ - කොළඹ දිස්ත්‍රික්කයෙත් තියෙන්නේ බස් 600 යි. ඉතින් කොහොමද ඒකාබද්ධ කාල සටහන් කරන්නේ. බස්නාහිර පළාත් සභාවටම තියෙන්නේ බස් 982 යි. C.T.B එකට. මේක තමයි යථාර්ථය. ඒ නිසා මම එදා ජනාධිපතිතුමාගේ අයවැය යෝජනාවලදී කිව්වා. අපේ සභාපතිතුමාත් එදා හිටියා. ඔක්කෝම මන්ත්‍රීවරු හිටියා. C.T.B එක පළාත් සභාවට අපට දෙන්න. අන්න එතකොට පුළුවන්. ඒකාබද්ධ කරලා වැඩ කරන්න පුළුවන්කමක් ඇති වෙනවා. අනෙක් එක පෞද්ගලික බස් හිමියෙකුගේ බස් එකක් පැය 16 ක් වැඩ කරනවා. උදේ පහට පටන් ගත්තාම රෑ නවයට ඉවර වුණා. රෑ අටට ඉවර වුණොත් පැය ගණන ගණන් කරලා බලන්න. එතකොට ඩ්‍රයිවර් කෙනෙක් තමාගේ රියදුරු අසුනේ ඉඳ ගෙන තමා මගියත් එක්ක යන්නේ. ජීවිත ගණනක් අර ගෙන යනවා. මෙයාගේ මනසට කොච්චර විවේකයක් තියෙනවාද යන්න? මේවාට කවුද පිළියමක් දෙන්නේ? C.T.B එක වාගේ අපට පැය අටට දුවන බස් නැහැ. රාජ්‍ය සේවය වාගේ පැය අටට වැඩ කරන ක්‍රමයක් නැහැ. පෞද්ගලික බස් සේවාවල Conductor - Driver ට රජයෙන් මුදල් දෙනවා නම්, වැඩ වාර දෙකකට ගමන් කරන්න මේ රාත්‍රි සේවයත්, ඔක්කෝම සේවාවන් කරන්න පුළුවන් කියලා මට මේක අභියෝගාත්මකව ප්‍රකාශ කරන්න පුළුවන්කමක් තියෙනවා. එතකොට දැන් මේ කරුණු ඔක්කෝම සෝදිසි කරලා බැලුවාම - දැන් බලන්න කෙටි ධාවන මාර්ග. බස් එකක වටිනාකම සභාපතිතුමනි, රුපියල් ලක්ෂ 47 යි. මේ බස් එක Finance කරලා වාරික ගෙවන්න දැම්මොත් මේ බස් එකට ගෙවල ඉවර වෙන කොට රුපියල් ලක්ෂ 68 ක් 70 ක් යනවා. එතකොට

දැන් මේක කොහොමද හොයන්නේ? ටයර් ගෙවෙනවා. එන්ජින් ගෙවෙනවා. තෙල් ගහන්න ඕනැ. ඩීසල් දෙන්න ඕනැ. කොන්දොස්තරට මාටිය දෙන්න ඕනැ. අයිතිකාර මහත්මයා කියනවා. ඒ නිසා දැන් මම යෝජනාවක් කරලා තියෙනවා. කෙටි ධාවන මාර්ග සඳහා පොඩි බස් ගෙනැල්ලා අලුත් සේවාවන් ආරම්භ කරන්න කටයුතු කරන්න. School Services. මම තව යෝජනාවක් ගෙනැල්ලා තියෙනවා. දැන් අපේ සිසු සැරිය, ගැමි සැරිය, මේ දෙකම ගෙනාවාම රාත්‍රි සේවයට දුවන්න කැමති බස් අපි ඉල්ලුවා රංජන්ලාගේ, ගැමුණු විජේරත්නලා ගේ සංගම්වලින් අපි ඉල්ලුවා, වැඩිපුර තියෙනවා නම් බස් අපට දෙන්න කියලා. එහෙම නැත්නම් ඕගොල්ලන්ට දුවන්න බැරි බස් තියෙනවා නම් අපට දෙන්න රාත්‍රි සේවයට දුවන්න. එතකොට අපි ඒ දුවන වාර ගණනත් එක්ක අර ගෙන, එයාලාට පාඩු නම් ඒ ආසන ගණනට මුදල් දෙනවා. ඒ කියන්නේ පාඩු අපි විඳ ගෙන මහජනයාට සේවාවක් කරන්න අපි යෝජනා කරලා තියෙනවා දැන්. ඒක President එක්ක කථා කරලා -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

පොඩි පාරවලට බස් දාන්නේ පළාත් සභාව ගානේද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පොඩි බස් ගේන්නේ පළාත් සභාවේ පොඩි පාරවල්වලට දාන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අපේ සභාවෙන්ද ගෙන්වන්නේ?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

සභාවෙන් නොවෙයි ගෙන්වන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

අමාත්‍යාංශයෙන් නොවෙයිද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඇයි? අමාත්‍යාංශයටත් ගෙන්වන්න අයිතියක් තියෙනවා. ඔයාටත් ඕනැද ගානක්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එපා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, දැන් මේ කාර්යය දිහා බැලුවාම මේ විෂය ගැන විවේචනය කරන්න පුළුවන්. මේ විෂයට මම මුහුණ දෙන හැටි දැක්කොත් සැමදාම උදේ පාන්දර පහ වෙන කොට නැගිටින්නේ කොහේ හරි වර්ජනයකින්. එක්කෝ Conductor බස් සල්ලි දීලා නැහැ. නැත්නම් Conductor ට C.T.B ඒකේ කට්ටිය ගහලා. එහෙම නැත්නම් මගියාත් එක්ක Conductor ගැටලුවක් ඇති කර ගෙන. මේ වාගේ දවස ගානේම අර්බුදකාරී සේවාවක් තියෙන්න හේතුව තමයි Driver යි Conductor යි කියන දෙදෙනාම රාජ්‍ය සේවයේ නිලධාරීන් නොවන නිසා. මේ අයට වගකීමක් පැවරිලා නැහැ. (බාධා කිරීම්) මේ කොන්දොස්තරටයි Driver ටයි මම සිරිලිය හරහා සමුපකාරයත් ඒකරාශි කරලා විශ්‍රාම වැටුපක් ගෙනැල්ලා තියෙනවා. එදා උපදේශක කාරක සභාවේ අපේ මෙරිල් ගරු මන්ත්‍රීතුමා, අපේ ජෝර්ජ් සංවිධායකතුමාලා අපි ඔක්කෝම කථා කරලා අපි විශ්‍රාම වැටුපක් ක්‍රියාත්මක කළාම මේගොල්ලන්ට පොඩි වගකීමක් ඇති වෙනවා. තමා විශ්‍රාමලාභියෙක්. ඒ නිසා තමාගේ සේවාව හරියට කරන්න ඕනැ කියලා. ඊළඟට පෞද්ගලික බස් මහත්වරු කරන වැඩේ තමයි මේ බස් එක දෙනවා උදේට ආවාම Conductor යි. Driver ටයි. දීලා කියනවා හවසට පන්දහසක් මට දීපන්. ඉතින් මේ ගොල්ලෝ පන්දාහක් ගන්න පාරේ මරාගන්න ඕනැ. දැන් එහෙම බදු දීලා තියෙන බස් ඔක්කෝම්වල Route Permit අපි අහෝසි කරන්න කටයුතු කරනවා. එතකොට තමයි තරගකාරිත්වයෙන් මේක කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ. ඊට පස්සේ අපි සෑම Conductor වයි, Driver වයි ගෙනැල්ලා පුහුණු පාඨමාලාවක් තියලා ඒ ගොල්ලන්ගේ ලයිෂන් එක අලුත් කරලා ඒ ගොල්ලෝ මගියෙක් නගින කොට කථා කරන්නේ කොහොමද? ආයුබෝවන් කියන්නේ කොහොමද? මගියාට ප්‍රියමනාපව කොහොමද හැසිරෙන්නේ? මේ විධියේ පුහුණු පාඨමාලාවන් දෙන්න අපි දැන් කටයුතු කර ගෙන යනවා. අපි මැලිබන් ආයතනයේ අනුග්‍රහය අර ගෙන - අපේ සල්ලි නැති නිසා අපි වෙනත් ආයතනත් එකතු කර ගෙන මේ කටයුතු කර ගෙන යනවා. දැන් මගියාට තවත් පහසුවක් දීම සඳහා අපි GSM තාක්ෂණය දෙනවා ටිකට් එක දෙන්න කටයුතු කරන්න. එතකොට මගියාට ඉතුරු සල්ලි ටික ලැබෙන්න. අයිතිකාරයාට මාටියා ගහන එක නැති වෙන්න. වෙලාවට කාලසටහනට දුවන්න. තාක්ෂණයත් එක්ක සෑම Bus stand එකකම අපේ නාම පුවරු ඇතුළත් කරනවා. ඒ ඔක්කෝම අපි ගානට කටයුතු කරනවා. අපේ චන්ද්‍රභානු මන්ත්‍රීතුමා අපේ අධිකාරිය ගැන කිව්වා. අපේ අධිකාරියේ නිලධාරී ඔක්කෝම මෙතැන උපවාසයේ හිර වෙලා ඉන්නේ. ඒ ගොල්ලෝ උපවාසයත් එක්ක ඉන්නවා. මොනවාටද උපවාස කරන්නේ? මේ ලොග් ෂීට් එක රුපියල් හත්සියය දාහ කළා කියලා. ඔයගොල්ලෝ හොඳ ප්‍රවාහන සේවයක් ඉල්ලනවා. මෙතැන අපට ආදායම් නැහැ. ආදායමක් වැඩි කර ගන්න පොඩි මුදලක් වැඩි කළාම උපවාස. වැඩ වර්ජන. ඒ නිසා දැනට මම රාත්‍රි සේවා ගමන් වාර ආරම්භ කරලා තියෙනවා. අවිස්සාවේල්ල - මතුගම.

අවිස්සාවේල්ල - කළුතර. ඊට පසුව අලුත්ගම - කොළඹ. ඊට පසුව දිවුලපිටිය - කොළඹ. ඊට පසුව තිට්ටඹුව - කොළඹ. අපි උදේ පාන්දර පහට පටන් ගන්නවා. හවසට රෑ හයෙන් පස්සේ ඒ සේවාවන් දුවන්න දැන් අපි කටයුතු කරලා තියෙනවාය කියන එක මම මතක් කරන්න ඕනෑ. මෙහෙම කරන්න අපට Conductor වරයෙකු Driver වරයෙකුයි පැය දහඅටක විතර කාලයක් සේවාවේ යෙදෙනවා. ඒ අයිතිකාරයෙකුට දෙදෙනෙකුට සල්ලි ගෙවන්න බැහැ. අපි අයිතිකාරයාගේ පැත්තත් බලන්න ඕනෑ. මේ නිසා තමයි අර කාල සටහන් හදන්න කිව්වාට, C.T.B එක කාල සටහන් හදන්නේ නැහැ. 40% ක් ඒ ගොල්ලන්ට. 60% ක් අපට. දවසකට අපේ බස් වාර දහයක් යනවා නම් ඒ ගොල්ලන්ට යන්න පුළුවන් දෙකයි. අනෙක් පැත්තෙන් මේ කාල සටහන්වලට යන්න බැරි හේතුව තමයි ප්‍රධාන මාර්ගවල යන්න පුළුවන්.

එතකොට දැන් මේ අශෝකා ලංකාතිලක මැතිනිය කියන අපේ ග්‍රාමීය මාර්ග. ග්‍රාමීය මාර්ගවල බස් එක ප්‍රධාන මාර්ගයට එන කොට අපේ කාල සටහන කඩා වැටෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් අපේ හයිලෙවල් පාර ගත්තාම එක තත්පරයට වේන් එක වාගේ බස් දහසයක් එනවා. එක විනාඩියට. ඇයි? අම්පාරෙන් එනවා. රත්නපුරෙන් එනවා. බලංගොඩින් එනවා. බදුල්ලෙන් එනවා. මහියංගනයෙන් එනවා. ඇඹිලිපිටියෙන් එනවා. ඒවා ඔක්කෝම අන්තර් පළාත්. අපේ බස් එක අවිස්සාවේල්ලෙන් පටන් ගන්න කොට අර බස් දහසයක් එක්ක Attack කර ගෙන එන්න ඕනෑ. ඒ ගොල්ලන්ට සීමිත නැවතුම් කියල එකක් නැහැ. අපේ ඉස්සර සීමිත නැවතුම් තිබුණා. මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කියනවා අපේ නම ගහලා. අපි ඒවා ගහලා තියෙන හේතුව තමයි, අර සීමිත නැවතුම්, සාමාන්‍ය නැවතුම් දෙක වෙන් කරන්න. එහෙම කරලා අපේ මගියාට යන්න පහසුව හදලා දෙන්න කටයුතු කරලා තියෙන්නේ. මෙතුමාටත් එහෙම නම ගහගන්න ඕනෑ නම් අපේ අධිකාරියට එක් ලක්ෂ හැත්තෑපන්දහසක් විතර ගෙව්වාම අපි Bus stand එකක් හදලා දෙනවා. ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා ඉල්ලුවා නම් දෙකක් මම අවුරුද්දට ඉස්සර වෙලා හදලා දෙනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

මට?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔයාටත් ඕනෑ නම් කියන්න. තමාගේ විමධ්‍යගත සල්ලි දුන්නාම මංචනායක මන්ත්‍රීතුමාටත් එහෙම හදා ගන්න පුළුවන්. ලංකාතිලක මැතිනියගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න ඕනෑ නම් අපේ මහ ආණ්ඩුවත්, අපේ පළාත් සභාත් ඒකරාශී වෙන්න ඕනෑ. මේක තනි පළාත් සභාවකට කරන්න බැහැ. පළාත් සභා නවයම ඒකාබද්ධ වෙන්න ඕනෑ. ලංකාවේ ගමනා ගමන මණ්ඩල සියල්ලක්ම ඒකාබද්ධ වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ලංකා ගමනාගමන මණ්ඩලය - අපි කලින් කිව්වා වාගේ පළාත් සභාවලට ඒකාබද්ධ කරලා ලබා දෙන්න ඕනෑ. එතකොට තමයි මේ සේවාවන් අපට ලබා දෙන්න පුළුවන්කමක් තිබෙන්නේ. තව අපට කථා කරලා කිව්වා දුම්රිය එක්ක ඒකාබද්ධ කරන්න කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔයගොල්ලෝ එන්න උදේකට මා එක්ක. මම උදේ පහට, හයට එළියට බහින්නේ. මම ගියා දෙමටගොඩට. දෙමටගොඩට ගියාම ලක්ෂයක් මිනිස්සු. ලක්ෂයක් එනවා, ඒ පහළොවේ විස්සේ කෝච්චි පෙට්ටිවල. උදේ 6.45 ඉඳලා හතහමාරයි, අටයි අතර වෙන කොට ලක්ෂයක් එනවා. මම අපේ රථවාහන නිලධාරීන් ගෙනිහිල්ලා ඒවා ගණනය කරලා බැලුවා. බම්බලපිටියට බස් එකක් තියනවා. හැබැයි, බත්තරමුල්ලට යන්න බස් එකක් නැහැ. දැන් මම කාර්යාල සේවා කියලා මේ බස් සේවාව ආරම්භ කළාම අර පැත්තෙන් වර්ජනය කරනවා. කොයි මන්ත්‍රීවරයාද මාධ්‍යයට කිව්වේ මේක හරියි කියලා. කොඩිකාර කරපු එක. දැන් මෙතැන ඇවිල්ලා විවේචනය කරනවා. කාර්යාලයට වැඩට යන නෝනා උදේ මූණ කට සෝදාලා තමාගේ අඳුම් ටික ඇඳගෙන, සෙන්ට් පවුඩර් ටික දාලා එන නෝනා යන්න ඕනෑ කොහොමද? ඒ සඳහා කවුද අපට සහාය දීලා තියෙන්නේ? මේ සඳහා අපි එකතු වෙන්න ඕනෑ. අපට සහාය දෙන්න. මේක පෞද්ගලික බස් සංගම් දෙකට ඕනෑ විදියට කරන්න පුළුවන්කමක් නැහැ. මේකේ එදා තිබුණු තත්ත්වය නොවෙයි අද තියෙන්නේ. අද මේකේ මහා තරගකාරීත්වයක් තියෙනවා. අද මහජන ප්‍රවාහන සේවය, පෞද්ගලික බස් සේවය කිව්වාම සේරම විකෘති වෙලා. ඒ මිනිස්සුන්ටත් ඇති වෙලා තියෙන ප්‍රශ්නය තමයි බස්වල මිල මුදලත් එක්ක Finance Company ත් එක්ක, ටයර්වල මිල ගණනුත් එක්ක බැලුවාම විශාල ප්‍රශ්න. ඒකට සහනයක් දෙන්න මම කටයුතු කළා. සමුපකාර අමාත්‍යාංශයෙන් ටයර් ගෙන්නලා සහනදායක ක්‍රමයට මාස හතරක් ණයට දුන්නා. මේ විදියට අපි සහනදායී ක්‍රමවේද රාශියක් හදලා දුන්නා. අර පැත්තෙන් විශ්‍රාම වැටුප. මෙහෙන් ටයර්. ඒ සේවක සේවිකාවන්ගේ ගෙවල්වල දරුවන්ට අධ්‍යාපන ඥානය දෙන අධ්‍යාපනික වැඩ සටහන්. කොන්දොස්තරට ඩ්‍රයිවර්ට අධ්‍යාපනික වැඩ සටහන්. මේ ඔක්කෝම ගෙනැත් දීලා තියෙන්නේ හොඳ ප්‍රවාහන සේවයක් දෙන්න කියලා මතක් කරනවා. ඔයගොල්ලන්ගේ පළාත්වල ඉන්නවා නම් පෞද්ගලික බස් තියෙන අය, රාත්‍රි සේවයට කැමති අය අපට දන්වන්න. අපි බලපත්‍ර නිකුත් කරලා දෙන්නම්. අනිවාර්යයෙන්ම.

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

රෑට විතරද බලපත්‍ර දෙන්නේ? දවල්ට දෙන්නේ නැද්ද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දවල්ට දුන්නාම, තදබදයත් එක්ක තවත් ප්‍රශ්නය ඇති වෙන නිසා ඒවාත් එක්ක මේවා විසඳන්න බැහැ නේ? රෑ සේවයට නේ ඉල්ලන්නේ. එතකොට අපට රාත්‍රි හත වෙන කොට අපේ රාජ්‍ය ආයතනවල ඔක්කෝම අය ගෙවල්වලට ගිහිල්ලා. හතහමාර, අට වෙන කොට සාමාන්‍යයෙන් 10% ක විතර පිරිසක්වත් පාරවල්වල නැහැ. බස් එකක් යොදවන මනුස්සයා Driver ටයි Conductor ටයි දීලා, ඩීසල් පෙට්‍රල්වලින් තමාගේ ගානවත් පියවෙන්නේ නැහැ. එක Turn එකක් එක පැත්තට යන කොට, අනෙක් Turn එක එන්න ඕනෑ නිස්. මේවා අපි කල්පනා කරන්න ඕනෑ. බොරුවට කයිවාරු ගහලා වැඩක් නැහැ. විවේචනය කරලා වැඩක් නැහැ. මේවා ගැන ගිහිල්ලා බලන්න ඕනෑ. පාරට බැහැලා මේ පිළිබඳව ඥානය ලබා ගන්න ඕනෑ. ප්‍රායෝගික වෙන්න ඕනෑ. මේ විධියට වැඩ කරන්න, ඉස්සරහට කටයුතු කරන්න. මම අලුත් සභාපතිවරයෙක් පත් කරලා තියෙනවා. එයා හොඳ දක්ෂ බුද්ධිමත් සභාපතිවරයෙක්. එයා යම් දෙයක් කරයි කියලා අපි විශ්වාස කරනවා. අද මේ යෝජනාව ගෙන ආ අශෝකා ලංකාතිලක මැතිනියට ස්තූතිවන්ත වෙමින් මේ ගැන කථා කරපු, මාව විවේචනය කරපු සියලු දෙනාටත් මම ඊළඟට මේ ගැන දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළට එන්න කියා ආරාධනා කරමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

[ අ.භා. 01.06 ]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, මම ස්තූතිවන්ත වෙනවා පිළිතුරු කථාවට විනාඩි තුනක් ලබා දීම පිළිබඳව. ඒ වාගේම ජෝර්ජ් පෙරේරා ගරු සංවිධායකතුමාට ස්ථිර කිරීම පිළිබඳවත්, අම්ජාඩ් ගරු මන්ත්‍රීතුමාටත්, චන්ද්‍රභානු අදිකාරම් ගරු මන්ත්‍රීතුමාටත්, අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමා සහ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාටත් මම ස්තූතිවන්ත වෙනවා, මේ යෝජනාවට අදහස් දැක්වීම පිළිබඳව.

[ අශෝකා ලංකාතිලක ]

මට හැමදාම බස් එකේ යන්න පුළුවන් කෙනෙක්. මම පළාත් සභා මන්ත්‍රීවරිය වශයෙනුත් ඊට පෙරත් බස්වලින් තමයි ගියේ. පළාත් සභා මන්ත්‍රී වෙලා ඉඳලත් මම බස්වල ගියා. ඒ නිසා බස්වල යන මගීන්ගේ දුක වේදනාව මම හොඳට හඳුනනවා. ඒ වාගේම බස් කොන්දොස්තර මහත්වරුන්ගෙන්, රියැදුරු මහත්වරුන්ගෙන් වන අසාධාරණකමුත් මම හොඳට හඳුනනවා. බස්වල යනකොට මම විශේෂයෙන් ඒ අයත් එක්ක රණ්ඩු කරලා තියෙනවා. හැබැයි, මනුස්සකම් තියෙන අය ඒකේ ඉන්නවා කියලා ඒ අයට ගෞරවයක් විධියට මම මේ වේලාවේ ප්‍රකාශ කරන්න කැමතියි. කොහොම වුණත් මේ රාත්‍රි බස් සේවය නැතිකම නිසා අපේ මගී ජනතාව, විශේෂයෙන්ම කාන්තා පක්ෂය විඳින දුක, අවනම්බු, අපහාස පිළිබඳව ඒ අය අපිත් එක්ක කථා කරනවා. අන්න ඒ නිසා තමයි මම මේ වාගේ යෝජනාවක් ගෙනාවේ. මම ඔබතුමාට යෝජනා කරනවා පුළුවන් නම්, මීට ඉස්සරවෙලත් කවුරු හරි මේ ගැන කිව්වා. ප්‍රයිවට් බස්වලින් බස් කිහිපයක් මාසයකට දවස් තුන, හතරක් දුවන මට්ටමට පත් කරන්න. ඒ කළාට මදී. ඒක Follow up කරන්න. පසු විමසුම් කරලා බලන්න. ඒ අය ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වෙනවාද කියලා. ඒවාට මහජන අදහස් ගන්න. එතකොට මේ අක්‍රමවත් ක්‍රියාව තුළ ක්‍රමානුකූලව මේ දේවල් කරගන්න අපට පුළුවන්කම තියෙනවා. මම දන්නවා. මෙතුමා හොඳ ඇමතිවරයෙක්. මෙතුමා ලොකු මහන්සියක් ගන්නවා. හැබැයි කොපමණ බුද්ධිය තිබුණත්, කොපමණ පුළුවන්කම තිබුණත් මේ බස් සේවාව සකස් වෙලා තියෙන ආකාරය කාටවත් ජය ගන්න ලෙහෙසි නැහැ. එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල C.T.B. එක විනාශ කරලා ඇති කරපු මේ ක්‍රමය යාවත්කාලීන කරන්න බොහෝ අයට අපහසුයි. ඒ නිසා අපි සියලු දෙනාම ඒක පොදුවේ පිළි අරගෙන අපි සංවාදයක යෙදිලා මේක ක්‍රමවත් කරන්න - (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අවුරුදු විස්සක් පොල් ගෑවද?

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

කාලය කොච්චර තිබුණත් තිවන් දකින්න බැහැ නේ? අවුරුදු විස්සෙන්? සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරන්න ඕනෑ. මේවාත් ඒ වාගේ දේවල්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. එතුමියගේ අන්තිම විනාඩි දෙක තියෙන්නේ.

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ඒක කරන්න තමුන්නාන්සේලාගේ සහයෝගයත් ලබා දෙන්න. අපි ඔක්කෝම දිවුරුම් දීලා ඇවිල්ලා තියෙන්නේ, ජනතාවට සේවය කරන්න මිස, කරන දේවල් පිළිබඳ වාද විවාද ඇති කරලා ඒක අනෙක් පැත්තට හරවන්න නොවෙයි. කරුණාකරලා සියලු දෙනාම එකතු වෙලා මේකට උපකාර කරන්න කියා ඉල්ලමින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාවට බෙදීමක් තියෙනවාද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීමේ යෝජනාව
ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතුය."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.07 ට, 2013 මැයි මස 07 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.07. p.m till 9.30 a.m. on 07.05.2013*